

# නියමුවා

> "විවිධ රටවලදී එය (විප්ලවය) විවිධාකාරයෙන් වර්ධනය වෙයි. එය නිතරම දිගු කාලයක් තිස්සේ දුෂ්කරතාවන්ගෙන් යුතුව ගමන් කරයි. ධනපතීන් තමන්ගේ අයිතීන් එක් වරම අත්හරිතියි සිතන සමාජවාදියා නරකය. නැත. ලෝකය විසින් තවමත් එවැනි කරුණාබරිත ධනපතීන් බිහිකර නැත. සමාජවාදය වර්ධනය විය හැක්කේ ධනවාදය හා සමග කරන අරගලයෙන් පමණි. සටනින් තොරව යටත්වූ පාලක පංතියක් ලොව මෙතෙක් කවරදාකවත් පැවතී නොමැත."
>
> ලෙනින්

ISSN 1391 - 1031 | 2023 අගෝස්තු | 27 වෙළුම | 12 කලාපය | ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත | පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී | ආධාරය රු 100/=




# ජනතාවගේ අරමුදල්

## කොල්ලකෑමට ඉඩ දිය නොහැකියි

**එක පසකින් භාණ්ඩාගාරයේ ධනය සොරකම් කළ පාලකයින් අනෙක් පසින් භාණ්ඩාගාරයට ලැබීමට තිබෙන ධනයද සොරකම් කරන බවත් ඒවා විනාශ කර රටට ණය ගෙවා ගැනීමට නොහැකි බංකොලොත් තත්වයක් ඇති කළ බවත් පෙන්වා දෙන ජාතික ජන බලවේගය, මේ වන විට ජනතාවගේ අරමුදල් වන සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල මංකොල්ලකෑමට පාලකයන් සූදානම් වන බවත් එයට කිසිසේත් ඉඩ නොතැබිය යුතු බවත් අවධාරණය කරයි.**

ජාතික ජන බලවේගය වෙනුවෙන් නායක අනුර දිසානායක සහෝදරයා මෙම අදහස් පළ කළේ 'EPF/ETF අරමුදල් මංකොල්ලය වහා නතර කරනු' යන තේමාවෙන් පසුගිය 31වැනි දින කොටුව දුම්රියපොළ ඉදිරිපිට පැවති විරෝධතා උද්ඝෝෂණයකින් අනතුරුව පැමිණ සිටි පිරිස අමතමිනි. එහිදී වැඩිදුරටත් කරුණු දැක්වූ අනුර දිසානායක සහෝදරයා මෙසේද පැවසීය.

"රනිල් වික්‍රමසිංහ බය ජනතාවට. ජනාධිපතිවෙලා වසරක් වෙනවා. නමුත් ජනාධිපති ලෙස, නිල හමුවීම් හැරුණු කොට ජනාධිපති ලෙස රටේ පොදු ජනතාව අමතන්න නොහැකි වෙලා තිබෙනවා. එයාගේ නිල බලයට ගොවීන් හෝ වැඩකරන ජනතාව කැඳවන්න බැරිවෙලා තිබෙනවා. අපේ රටේ කර්මාන්තකරුවා, දේශීය ව්‍යවසායකයා, විනාශ කර තිබෙනවා. අද මේ රට තිබෙන්නේ හොර දේශපාලන කල්ලියක් හා ජාවාරම්කාරී ව්‍යාපාරික පෙළැන්තියක් අතේ. බිස්කට්, සපත්තු, ඇඳුම්, ටයර්, කර්මාන්ත කඩා වැටිලා. කර්මාන්තකරුවා ඉන්නේ අමාරුවෙන්. බදුවලින් ගහන, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට බොරු ෆයිල් දෙන, රේගුවෙන් ගහන, බදු වංචා කරන, ජාවාරම්කාර පෙළැන්තියයි, රනිල්ගේ දේශපාලන කල්ලියයි විතරයි යහතින් ඉන්නේ. අනෙක් හැමෝම පීඩාවට පත්කර තිබෙනවා.

වරායේ සේවක අර්ථසාධක අරමුදල තැන්පත් කර තිබෙන්නේ භාණ්ඩාගාර බිල්පත්වල. විදුලි බල මණ්ඩලයේත්, මිලකෝ ආයතනයේත් මේ ආදී සංස්ථා, මණ්ඩලවල සේවක අර්ථසාධක අරමුදල තැන්පත් කර තිබෙන්නේ භාණ්ඩාගාර බිල්පත්වල. මේ අරමුදල් මංකොල්ලකන්න හදනවා. දැන් හොරා ගෙට ඇවිත් ඉන්නවා. මේ රටේ ජනතාව තමන්ගේ අරමුදලේ ආරක්ෂාව වෙනුවෙන් පෙළගැහෙන්න ඕනෑ. මේ පෙළගැසීම වළක්වන්න මර්දන නීති ගෙනත් පුළුවන් කියලා රනිල් වික්‍රමසිංහලා හිතනවා.

ප්‍රජාතන්ත්‍රවාදය අකුළලා, තහනම් නීති ගෙනත්, වාරණ නීතිවලින් ජනතාව නතර කරන්න හදනවා. ඉස්පිරිතාලවල බෙහෙත් නැතිව මිනිස්සු මැරෙනවා. ජනතාවගෙන් 68%කට හරිහමන් ආහාර වේලක් නැහැ. දරුවන්ට හරිහමන් ආහාර වේලක් දෙන්න නොහැකි,

11 වැනි පිටුවට



ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභික
විජිත හේරත් සහෝදරයා

## ජනතාව වහලුන් කරන IMF නියෝග ආණ්ඩුව වහා හකුළා ගත යුතුයි

අයි.එම්.එෆ්. කොන්දේසි අනුව වැඩකරන ජනතාව වහලුන් බවට පත්කිරීමට නව කම්කරු පනතක් බලාත්මක කිරීමට ආණ්ඩුව උත්සාහ කරන බව පෙන්වා දුන් ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික විජිත හේරත් සහෝදරයා නව පනත සම්මත වුවහොත් වහල් සේවය ස්ථාපිත කෙරෙන තත්වයක් ඇති වන බවත් ලක්ෂ සංඛ්‍යාත වැඩකරන ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් යෝජිත කම්කරු පනත වහා හකුළා ගන්නා ලෙස ආණ්ඩුවට බල කරන බවත් අවධාරණය කළේය.

විජිත හේරත් සහෝදරයා මේ බව පැවසුවේ ජාතික ජන බලවේගය විසින් පසුගිය 16වැනි දින පවත්වන ලද මාධ්‍ය සාකච්ඡාවක් අමතමිනි. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ විජිත හේරත් සහෝදරයා මෙසේද පැවසීය.

"ආර්ථිකමය වශයෙන් රටක් බංකොලොත් වී තිබෙන වෙලාවක කළ යුත්තේ වැඩකරන ජනතාවගේ අයිතිවාසිකම් තවදුරටත් ආරක්ෂා කිරීමයි. ආර්ථික වශයෙන් දුබල ජනතාවගේ අයිතීන් ආරක්ෂා කිරීමයි. නමුත් ණය ප්‍රතිව්‍යුහගත කිරීම මගිනුත් 'අස්වැසුම' මගිනුත් නව කම්කරු නීති මගිනුත් පීඩිත ජනතාව තලාපෙළීම ආණ්ඩුවේ කාර්යභාරය වී තිබෙනවා. අයි.එම්.එෆ්. යෝජනාවලට යටවුණු ආණ්ඩුව සෑම ක්ෂේත්‍රයකම ජනතාව දඬයම් කිරීම ආරම්භ කර තිබෙනවා.

වැඩකරන ජනතාව ජීවිත පරිත්‍යාගයෙන් දිනාගත් පැය අටේ වැඩ දිනය යටපත් කොට සතියට පැය 45ක් දක්වා

11 වැනි පිටුවට


### 03 කොරහ බිඳගෙනම යාම...

පාලක කල්ලියක් අපේක්ෂාභංගත්වයට පත්වූ විට හැසිරෙන්නේ මේ ආකාරයෙන්මය. ඔවුහු බියවී සිටිති. කෝපයට පත්ව සිටිති. කලබල වී සිටිති. බලය අත්හැරීමට සිදු වන බව සිතෙන විට වියරු වැටෙමින්...




### 05 ආණ්ඩුවේ වුවමනාවට...

දැනට අරමුදලේ රුපියල් ලක්ෂ 10ක් ඇති අයකුට මෙමගින් ඇතිවන පාඩුව වසරකට රු. 103,000ක් පමණ වේ. එසේම මෙමගින් සමස්ත අරමුදලට වසර 16 තුළ අත්වන පාඩුව ට්‍රිලියන 06කට අධිකය. මෙම දත්ත අනුව පෙනී යන්නේ EPF අරමුදලේ පැවැත්ම අනාගතයේ දැඩි බලපෑමකට...




### 09 සහකම්පනයෙන් තොර...

දැන් තවදුරටත් අපේ සමාජයට මේ ආකාරයෙන් ඉදිරියට යාමට නොව, පැවතීමටද නොහැකි ඉමකට පැමිණ තිබේ. එය විසින් ඉල්ලා සිටින්නේ කුමක්ද? ඒ, පවතින සමාජ, ආර්ථික, දේශපාලන දේහයේ ගැඹුරු වෙනසකි. සමාජ පරිවර්තනයකි. මරාදමා ඇති මනුෂ්‍යත්වයට පණ දෙන නව සමාජයක්...



තරුණ................ 04
ජාත්‍යන්තර................ 06
ආර්ථිකය ................ 07
කාන්තා................ 08
විශේෂාංග................ 10
වේදිකාව................ 11

යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!

ජාතික ජන බලවේගයේ මාධ්‍ය හමුව - 2023.07.29

# ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සමුළු රට පුරා අති සාර්ථකව



විකිණීමට, EPF/ETF කොල්ලයට, ජීවන බරට, මර්දනයට, මැතිවරණ කල් දැමීමට, බදු බරට හා අසාධාරණ කම්කරු නීති සංශෝධනයට එරෙහිව ජන බලය ගොඩනගන ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ දිස්ත්‍රික් සමුළු ගණනාවක් පවත්වා ඇති අතර ඒ සඳහා විශාල වැඩකරන ජනතා සහභාගිත්වයක් පැවති බව ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ ලේකම් මහින්ද ජයසිංහ සහෝදරයා නියමුවා වෙත පැවසීය. මේ වන විට ගම්පහ, පොළොන්නරුව, මාතලේ, පුත්තලම, බදුල්ල, හම්බන්තොට, අනුරාධපුරය, මොණරාගල යන දිස්ත්‍රික්කයන්හි මෙම සමුළු පැවැත්වූ බවත් ඉදිරි දින කිහිපය තුළ ගාල්ල, රත්නපුරය, මාතර ඇතුළු තවත් දිස්ත්‍රික්ක ගණනාවක මෙම සමුළු පැවැත්වීමට තීරණය කර ඇති බවද ඔහු වැඩිදුරටත් කියා සිටියේය.

# EPF/ETF කොල්ලයට හා අසාධාරණ කම්කරු නීතිවලට එරෙහිව දැවැන්ත විරෝධතා මාලාවක්



ආණ්ඩුව විසින් IMF කොන්දේසි අනුව සිදුකරන දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය යටතේ සිදුකරන සේවක අරමුදල් කොල්ලයට හා අසාධාරණ කම්කරු නීති සංශෝධනවලට එරෙහිව මේ වන විට රට පුරා විරෝධතා ක්‍රියාමාර්ග අරඹා ඇත. රාජ්‍ය, පෞද්ගලික, වතු සේවකයින් නියෝජනය කරමින් EPF/ETF කොල්ලයට එරෙහි සටන් ව්‍යාපාරය මගින් වරාය, විදුලි, ජල අර්ධ රාජ්‍ය ආයතන ඉදිරිපිට මෙන්ම රට පුරා පෞද්ගලික අංශයේ වැඩබිම් මට්ටමින් හෝටල්, වෙළඳ කලාප ඉදිරිපිට විරෝධතා ගණනාවක් හා කම්කරු දෙපාර්තමේන්තුව ඉදිරිපිටදීද උද්ඝෝෂණ පැවැත්වූ අතර පසුගියදා කොළඹ කොටුව දුම්රිය ඉදිරිපිටදී දැවැන්ත උද්ඝෝෂණයක් පැවැත්විණි. මේ සඳහාද රාජ්‍ය, පෞද්ගලික අංශ මෙන්ම වෙළඳ කලාප නියෝජනය කරමින් විශාල සේවක පිරිසක් සහභාගි වී සිටියහ.

# ඖෂධ හිඟයට, බාල ඖෂධවලට, උපකරණ හිඟයට, සෞඛ්‍ය පෞද්ගලීකරණයට එරෙහිව විරෝධතා




ආණ්ඩුව විසින් බාල ඖෂධ ගෙන්වීම මගින් මතුව ඇති සෞඛ්‍ය සේවා අර්බුදයත්, එසේම ඖෂධ හිඟය, උපකරණ හිඟය ඇතුළු කරුණු ගණනාවක් මුල්කරගනිමින් සෞඛ්‍ය සේවා වෘත්තීය සමිති එකමුතුව මගින් රට පුරා රෝහල් ඉදිරිපිට විරෝධතා උද්ඝෝෂණ අරඹා ඇත. ඒ අනුව පසුගියදා කොළඹ ජාතික රෝහල, රාගම රෝහල, මහනුවර, බදුල්ල, රත්නපුර ඇතුළු රෝහල් ගණනාවක මෙලෙස විරෝධතා උද්ඝෝෂණ පවත්වනු ලැබිණි. මේ සම්බන්ධයෙන් වෛද්‍ය ජයන්ත බණ්ඩාර සහෝදරයා පැවසුවේ ආණ්ඩුව ගන්නා තීරණ නිසා ජනතාව සෞඛ්‍ය සේවාව මත තබා ඇති විශ්වාසයට විශාල ප්‍රහාරයක් වැදී ඇති බවය. මේ සම්බන්ධව සියලු ජනතාව දැනුවත් කරමින් ජනතාවට යහපත් සෞඛ්‍ය සේවාවක් ලබාදීම වෙනුවෙන් සියලු වෘත්තීය සමිති ඒකාබද්ධව ක්‍රියාමාර්ග ගනිමින් සිටින බවද ඔහු කියා සිටියේය.

# අස්වැසුමෙන් ජනතාව දැවැන්ත පීඩාවකට, ගැටලු විසඳන්න වෘත්තීය සමිති බලකරයි



අස්වැසුම මගින් විශාල දුප්පත් ජනතාවකට සහන ප්‍රතිලාභ අහිමි කර ඇති බවත් එයින් මතු වී ඇති අර්බුදය නොවිසඳා සුහසාධන වැඩපිළිවෙළ දේශපාලනීකරණය කිරීමේ ආණ්ඩුවේ උත්සාහයක් පවතින බවත් සමෘද්ධි සංවර්ධන නිලධාරී සේවා සංගමයේ ලේකම් චාමර මද්දුමකලුගේ සහෝදරයා මාධ්‍ය හමුවක් අමතමින් පැවසීය. මේ වන විට සමෘද්ධි බැංකු පද්ධතිය අක්‍රිය කිරීමේ වැඩපිළිවෙළක් මෙමගින් ක්‍රියාත්මක වී ඇති බව පවසන ඔහු දුප්පත් ජනතාව පාරේ තබා රස්තියාදු කරමින් ආණ්ඩුව සිදු කරන්නේ තව තවත් ජනතාව පීඩාවට පත් කිරීම මිස ඔවුන්ගේ ප්‍රශ්න විසඳීමට කටයුතු කිරීම නොවන බව පැවසීය. එසේම IMF කොන්දේසි අනුව ආණ්ඩුව 2024 වන විට ලක්ෂ 12 ක පමණ පිරිසකට පමණක් ප්‍රතිලාභ ලබාදීමට තීරණය කොට ඇති නමුත් ආණ්ඩුවේ දේශපාලකයින් මැදිහත් වී ජනතාවගේ ගැටලු දේශපාලනික වුවමනාව වෙනුවෙන් යොදාගැනීමට කටයුතු කරමින් සිටින බව පෙන්වා දුන් ඔහු කඩිනමින් නැවත සමීක්ෂණයක් සිදුකොට ප්‍රතිලාභ ලැබිය යුත්තන්ට එම සහනාධාර ලබාදෙන ලෙස ආණ්ඩුවට බල කරන බව අවධාරණය කළේය.

## ජන අයිතීන් උල්ලංඝනය වීමේදී, අපි ජනතාව සමග සිටගන්නවා

### ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභික
### නීතිඥ හර්ෂණ නානායක්කාර



ඡන්දයකිනුත් පත් නොවුණු, ව්‍යවස්ථාවේ සිදුරකින් බලයට ආපු, ජනාධිපතිවීමට සදාචාර අයිතියක් නැති රනිල් වික්‍රමසිංහ සහ ඔහුගේ ආණ්ඩුව විසින් අමු අමුවේ ව්‍යවස්ථාවේ වගන්ති උල්ලංඝනය කිරීමට රාජ්‍ය යාන්ත්‍රණය මෙහෙයවමින් ඉන්නවා. භාෂණයේ, කතාකිරීමේ, විරෝධතා දැක්වීමේ නිදහස ව්‍යවස්ථාවෙන් අපට ලැබී තිබෙනවා. නමුත් ඊයේත්, ඊට පෙර දිනයේත් නිරායුධව අතේ බෝඩ් පමණක් තබාගෙන සාමකාමී විරෝධය පෑමට පොලීසිය විසින් අනීතික ලෙස පහර දෙන්නේ කොහොමද?

මෙය හරියට අපේ ගෙදරට බලහත්කාරයෙන් හොරෙක් පැනලා, අපිට ගෙදර, කරන්න ඕන දේ කියලා කොන්දේසි දමනවා නම්, එය අපි ඉවසන්නේ නැහැ. අපි හොරාට එන්න කීවෙත් නැහැ. පිටිපස්සා දොර හැර තිබියෙදී ඌ ආවේ. ඒ වගේ තමයි රනිල් වික්‍රමසිංහත්. ඡන්දෙන් පැරදිලා ගෙදර ඉන්න කොට ගෝඨාභයට කරදර වුණු වෙලාවෙ පිටිපස්සා දොරෙන් ගෙදරට පැනපු හොරා. දැන් අපිට පීඩාවට පත් කර කර, අපිව මංකොල්ල කකා, අපේ ගෙදර අපිට පාට් දමමින් ඉන්නවා නම්, ජනතාවක් වශයෙන් අපි මෙය ඉවසා සිටිය යුතුද? අපිව පීඩාවට පත්කරන්නේ ඒ පැනපු මහ හොරා.

තරිඳු ඉඳුවර මාධ්‍යවේදියා පොලීසිය අත්අඩංගුවට ගෙන පැය කිහිපයකට පස්සේ ඉස්පිරිතාලේ ඉන්න තරමට තුවාල නම්, අපිට පේනවා රාජ්‍ය ත්‍රස්තවාදය මුදා හැරීමක් කර තිබෙන බව. මෙවැනි දේ නීත්‍යානුකූල කර ගැනීමට තමයි, ප්‍රති ත්‍රස්ත පනත වැනි පනත් ගේන්නේ. ඒ වගේම මාධ්‍යවලට හිරිහැර කරන්න මාධ්‍ය විකාශන අධිකාරී පනත ගේන්නේ. මාධ්‍යත් වසා, මිනිසුන්ගේ කටත් වසා කටයුතු කළ හැක්කේ ජනතාවට බය රනිල් වික්‍රමසිංහ වැනි පුද්ගලයෙකුට පමණයි. ඔබගේ ව්‍යවස්ථාපිත අයිතීන් උල්ලංඝනය වෙනවා නම්, හිරිහැරයක් වෙනවා නම් ජාතික ජන බලවේගයේ අපි ඔබත් සමග හිටගන්නවා.

## අශිෂ්ට ලෙස පහර දී ඇදගෙන යන්නේ විශිෂ්ට මානව සම්පතක්

### ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභික - ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ
### මහාචාර්ය හිනිදුම සුනිල් සෙනෙවි



මේ රට හපයක් කර, අහකදාපු රටක්. අශිෂ්ට ලෙස පහර දී ඇදගෙන යන්නේ විශිෂ්ට මානව සම්පතක්. මේ දැන් හොඳටම ඇති. ජාතික සහ ජාත්‍යන්තර මානව හිමිකම් ආයතනවලින් අපි ඉල්ලනවා කරුණාකර මේ දෙස බලන්න. මේ නීති අමු අමුවේම උල්ලංඝනය කරන්න කිසිසේත්ම බැහැ. අපි රටක් හැටියට ඒ ගිවිසුම්වලට බැඳී ඉන්නවා. පොලීසිය කියනවා රාජකාරියට බාධා කළා කියලා. පොලීසියට පමණක්ද රාජකාරි තිබෙන්නේ. මාධ්‍යවේදී තරිඳු උඳුවරගෙදරත් සිටියේ ප්‍රශස්ත වෘත්තීය කටයුත්තේ. ඔහු නිරායුධව සිටි මිනිසෙක්. ඔහු තමන්ගේ රස්සාව කරමින් සිටි කෙනෙක්. ඔහුගේ රාජකාරියට බාධා වී තිබෙනවා. ඔහුව ඇදගෙන යන්නේ ඔවුන්ගේ දෙයක් සොරකම් කළ නිසා නොවෙයි. ඉහළින් ලද නියෝගයක් ක්‍රියාත්මක කිරීම නිසයි. මේක තමයි ඔවුන්ගේ ක්‍රියා පිළිවෙත. ඔවුන් ප්‍රජාතන්ත්‍රවාදය දෙස බලන ආකාරය තමයි මේ එළියට එන්නේ.

මේ රට පොලිස් රාජ්‍යයක් බවට පත්කරන්නද මේ හදන්නේ. පොලීසිය, හමුදාව කියන්නේ රාජ්‍ය මර්දන උපකරණ බව අපි දන්නවා. අපි ගෞරවණීය මහත්වරුන්ගෙන් ඉල්ලා සිටින්නේ, ඔබගේ ආත්ම පරීක්ෂාවත් මෙතනදී සිදුවෙනවා. ඔබ කොහොමද, මනුෂ්‍යත්වය, සදාචාර නීති, බිඳදමා කටයුතු කරන්නේ? ඔබව නඩත්තු කරන, බදුගෙවන ජනතාවට වගවෙන්නේ මෙසේද? පුරවැසියන් හැටියට අප කල්පනා කළයුතුයි. නිල ඇඳුම නැති විට ඔබ සාමාන්‍ය පුරවැසියෙක්. ඔබ ගෙදර යන විට සාධාරණ වෙනත් උද්ඝෝෂණයකදී ඔබේ පුතා හෝ දුව හෝ බිරිඳ මේ විදිහටම අත්අඩංගුවට පත්වෙලා තිබෙන්න පුළුවන්. මර්දනය යටතේ කුඩුවේ ඉන්න ඉඩ තිබෙනවා.

ඉන්ධන නැති වුණාම, ආහාර නැති වුණාම අපි ඒකට හුරු වෙනවා. රනිල් වික්‍රමසිංහ හිතනවා ඇති ඒ වගේ මේ මර්දනයන්ටත් අපි හුරුවේවි කියලා. සියලු බලවේගවලින්, ජනතාවගෙන් අපි ඉල්ලා සිටිනවා, හෘදසාක්ෂිය අවදි කර ගන්න. මර්දනය ඔබේ දොරකඩට ඇවිත් තිබෙනවා. මේ මර්දනයට එරෙහි වන්න.

## මිනිසුන්ට අතපය හකුළාගෙන ඉන්න කියා කියනවා නම්, එය කවදාවත් සිදු නොවන දෙයක්

### ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභික
### ප්‍රවීණ රංගන ශිල්පී ජගත් මනුවර්ණ



රනිල් වික්‍රමසිංහගේ විකෘති මනෝභාවය දිනෙන් දිනම එළිදක්වමින් ඉන්නවා. ඔහුට අවශ්‍ය වෙලා තිබෙනවා තමන් ශක්තිසම්පන්නයෙක් බව පෙන්වන්න. තරිඳු අත්අඩංගුවට ගැනීමෙන් නිදහස් මාධ්‍යවේදීන්ට සහ මාධ්‍යකරණයේ නියැලෙන පුද්ගලයන්ට ලබාදෙන භයානක සංඥාවක් තිබෙනවා. රාජපක්ෂ පාලන අවදියේදිත් මාධ්‍යවේදීන්ට සහ මාධ්‍ය ආයතනවලට යම් යම් අකටයුතුකම් සිදුවුණා. රනිල් වික්‍රමසිංහත් මේ වෙනකොට අත්හදා බලන්න ගන්නා උත්සාහයක්ද කියා හිතන්න වෙනවා.

රනිල් වික්‍රමසිංහට අපි කියනවා, ඔබ අනීතිකව බලයට ආ ජනාධිපතිවරයෙක්. ජනවරමක් නැති ජනාධිපතිවරයෙක් හැටියට, පොලීසිය, හමුදාව පාරට ගෙනත්, ජනතාවගේ භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහසට බාධක පමුණුවන්න ඔබට අයිතියක් නැහැ. මිනිස්සුන්ට රෝහලවල බෙහෙත් නැතිව පීඩා විඳිද්දී, ගෙන්වන ලද බෙහෙත් විෂ වී රෝහල්වල මිය යද්දී, දරුවන්ගෙන් විශාල ප්‍රමාණයක් මන්දපෝෂණයෙන් පෙළෙද්දී, පාසල් දරුවාට අවශ්‍ය උපකරණ ටික ගැනීමට නොහැකිව සිටිද්දී, දරුවන්ට අවශ්‍ය කෑම ටික, දෙන්න නොහැකිව දෙමව්පියන් දුක් විඳිද්දී, මිනිසුන්ට අතපය හකුළාගෙන ගෙවල්වලට වෙලා ඉන්න කියා රනිල් රාජපක්ෂ කියනවා නම්, එය කවදාවත් සිදු නොවන දෙයක්. හමුදා, පොලීසිය දහස් ගණනින් පාරට ගෙනත් මේ උද්ඝෝෂණ නවත්වන්න උත්සාහ කළත් එය නොකළ හැකි බව මතක තබා ගත යුතුයි.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# රනිල්ගේ සර්ව පාක්ෂික අටමගල

බරපතළ ගැටලුවලින් මඟහැර යාම සඳහාත්, එවැනි ගැටලුවල වගකීම අන් අය මත පැටවීම සඳහාත් 'කමිටු' පත්කිරීම හා 'සර්ව පාක්ෂික සමුළු' කැඳවීම රනිල් වික්‍රමසිංහගේ මෝස්තරයක් බවට පත්ව තිබේ.

ජනාධිපති රනිල් වික්‍රමසිංහ කැඳවන ලද අලුත්ම සර්වපාක්ෂික සාකච්ඡාව වූයේ පසුගිය ජූලි 26දා කැඳවනු ලැබූ සාකච්ඡාවය. එහි අරමුණ ලෙස ජනාධිපතිවරයා ප්‍රකාශයට පත්කර තිබුණේ උතුරේ ජාතික ප්‍රශ්නය විසඳීම සඳහා 'ජාතික එකඟතාවයක්' ඇතිකර ගැනීමය.

එහෙත් ජූලි 26 සවස එකී සර්වපාක්ෂික නොවන සාකච්ඡාව අවසන් වූයේ සුපුරුදු ලෙසම කිසිදු එකඟතාවයක් ඇතිකර ගැනීමෙන් තොරවය. එම සාකච්ඡාව 'සර්වපාක්ෂික' සාකච්ඡාවක් නොවුණේ එයට පාර්ලිමේන්තුව නියෝජනය කරන හා රට තුළ ජන බලයක් සහිත දේශපාලන බලවේගය වූ ජාතික ජන බලවේගය සහභාගි නොවීම නිසාය. රනිල්ගේ මෙම සර්වපාක්ෂික අටමගලට සහභාගි නොවීමට ජාතික ජන බලවේගය ගත් තීරණය ඉතාම නිවැරදි බව තහවුරු වූයේ කිසිදු ඵලදායී සාකච්ඡාවකින් හෝ තීරණයකින් තොරව රැස්වීම අවසන් වූ ආකාරය නිසාය.

මෙරට පාලකයින්ට ලංකාවේ ජාතික ගැටලුව විසඳීමේ සැබෑ ඕනෑකමක් කිසිදාක තිබුණේ නැත. 13වැනි සංශෝධනයද ඉන්දියානු බලපෑම නිසා නොකර බැරි තත්වයට පත්වූ ජයවර්ධන විසින් කළ දෙයක් මිස ප්‍රශ්නය විසඳීම සඳහා ගත් අවංක උත්සාහයක් නොවේ. මේ දක්වාම 13වැනි සංශෝධනයේ 'විසඳුම්' සැබෑ විසඳුමක් බවට පත් නොවී තිබෙන්නේද ඒ නිසාය. (සියලු ජනයාට සමානතා පදනම මත අයිතීන් දීම පදනම් කරගත් විසඳුමක් ගැන මොවුන් සිතාවත් නැත.)

ඉන් පසු සිදුවූයේ කුමක්ද? මැතිවරණයක් ළංවන විට උතුරේ ඡන්ද බලාගෙන හා ඉන්දියානු බලපෑම නිසා පාලකයන් විටින් විට 13 ගැන විවිධ කතා ගෙතූහ. ඒ සඳහා විටින් විට සර්වපාක්ෂික සාකච්ඡාද පැවැත්වූහ. ඒ සියල්ලම අවසන් වී ඇත්තේ කිසිදු එකඟතාවයකින් හෝ අඩු ගණනේ යෝජනාවකින්ද තොරවය. ඒ අනුව පාලකයෝ එක් පැත්තකින් දෙමළ ජනතාව හා ඉන්දියාව රැවටීමට උත්සාහ කළ අතර අනෙක් පැත්තෙන් ප්‍රශ්නයෙන් පළා ගියහ. පසුගිය ජූලි 26 රනිල් නැවත සිදුකළේද එයමය.

ඊනියා සර්වාපාක්ෂික සාකච්ඡාවේදී රනිල් පවසා තිබුණේ තමන්ට තනි පුද්ගලයෙක් ලෙස කිසිවක් කළ නොහැකි බවත් ඒ සඳහා ජනවරමක් නොමැති බවත්ය. රනිල්ගේ කපටි වුවමනාව ඉතා පැහැදිලිය. ඔහු උත්සාහ කරන්නේ මෙම අති සංවේදී ප්‍රශ්නය විසඳීමට තමන් උත්සාහ කළද අනෙක් පක්ෂවල සහය නොලැබුන නිසා එය ඉටුකිරීමට නොහැකි වූ බව පවසා ඇඟ බේරා ගැනීමටය.

රනිල් වික්‍රමසිංහලා කළ යුතු වන්නේ කුමක්ද? සර්වපාක්ෂික සාකච්ඡාවක් ජනාධිපතිවරයා විසින් කැඳවනු ලබන්නේ නම් සාකච්ඡාව සඳහා ඔහුගේ හා ආණ්ඩුවේ යෝජනා මාලාව ඉදිරිපත් කළ යුතුය. සාකච්ඡාවක් සඳහා නිමිත්තක් ඇති වන්නේ එවිටය. එහෙත් සර්වපාක්ෂික සාකච්ඡා කැඳවන රනිල් එයට එන්නේ හිස් අතිනි. එවිට මෙම ඊනියා සර්වපාක්ෂික සාකච්ඡාව ආඩි හත් දෙනාගේ කැඳ හැලිය බවට පත්වීම වැළැක්විය නොහැක. රනිල් වික්‍රමසිංහට සමහර තීරණ තනිව ගැනීමට ජනවරමක් නැති බව මතක් වී තිබෙන්නේ උතුරේ ප්‍රශ්නය ඔහු විසින්ම මතුකර ගත් තත්වයක් තුළය. එහෙත් රටේ වටිනා ජාතික සම්පත් විකිණීමේදී, ණය කපා හැරීම සඳහා ඊපීඑෆ්, ඊටීඑෆ් අරමුදල් කප්පාදුවේදී, ඡන්ද වැළැක්වීමේදී, ඔහුට ජනවරමක් නැති බව මතක් නොවේ. එම කටයුතුවලදී ඔහු හැසිරෙන්නේ ජනවරමට අමතරව "දුම්මල වරමද" ගත් කෙනෙක් සේය. රනිල්ගේ වංක, කපටි දේශපාලනය තේරුම් ගැනීමට මේ සිදුවීම වුව හොඳටම ප්‍රමාණවත්ය.

ජාතික ප්‍රශ්නය විසඳීමට තමන් සූදානම් බව බොරුවට පෙන්වා ඒ සඳහා සර්වපාක්ෂික සාකච්ඡා කැඳවන්නේ නම් රනිල් පළමුව කළ යුත්තේ ඔහුත් ඔහුගේ ආණ්ඩුවත් මේ පිළිබඳව ඇතිකරගෙන තිබෙන එකඟතාවය හා ආණ්ඩුවේ ස්ථාවරය පළමුව ඉදිරිපත් කිරීමය. මෙම ප්‍රශ්නය විසඳීම සඳහා කරනු ලබන යෝජනාවන් මොනවාද ඒවාට ජනාධිපති ලෙස රනිල් වික්‍රමසිංහත්, අගමැති ලෙස දිනේෂ් ගුණවර්ධනත්, ආණ්ඩුව පවත්වාගෙන යන පොහොට්ටුවේ ප්‍රධානියා ලෙස මහින්ද රාජපක්ෂත්, ආණ්ඩුවත් එම යෝජනා සඳහා එකඟතාවයක සිටිනවාද යන්න ඉදිරිපත් කළ යුතුය.

මෙම ගැටලුව විසඳීම සඳහා ජාතික එකඟතාවයක් ඇතිකර ගැනීමට පෙර ආණ්ඩුවේ පාර්ශ්ව අතර එඟතාවයක් තිබීමත් එම එකඟතාව කුමක්දැයි රටට කීමත් අතිශය වැදගත්ය. එසේ නොකර කැඳවන ඕනෑම සර්පාක්ෂික සාකච්ඡාවක්, වංචාවක්, ප්‍රශ්නයෙන් පළා යාමක්, ඇඟ බේරා ගැනීමක්, දේශපාලන උගුලක් මිස අන් යමක් නොවනු ඇත.

# කොරහ බිඳගෙනම යාම

"යන යකා කොරහත් බිඳගෙනම යනවා" යයි කියමනක් අපේ ජනවහරේ තිබේ. වර්තමාන ආණ්ඩුවේ ක්‍රියාකලාපය දෙස බලන විට පෙනී යන්නේ අවසන් ගමන් යාමට නියමිත රනිල්-රාජපක්ෂ පාලනය 'කොරහත් බිඳගෙනම' යාමට සූදානම් වන බවය.

ලංකාවට ඊනියා විවෘත ආර්ථිකය හෙවත් නව ලිබරල්වාදී ආර්ථිකය හඳුන්වා දුන්නේ රනිල්ගේ මාමා වූ ජේ. ආර්. ජයවර්ධනය. ඒ, 1978 දීය. එහෙත් මේ දක්වා ඔවුනට එය සම්පූර්ණයෙන් ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. ඒ, මෙරට වැඩකරන ජනතාවගේත්, වමේ, ප්‍රගතිශීලී බලවේගවලත් බලපෑම නිසාය.

දැන්, ගෝඨාභය රාජපක්ෂ පලායාම නිසා හිස් වූ ජනාධිපතිකමට මහින්ද රාජපක්ෂලා විසින් පත්කරගනු ලැබූ රනිල් නව ලිබරල්වාදයේ අවසන් ඉනිම ක්‍රීඩා කිරීම අරඹා ඇත. ඒ, පසුගිය කාලයේ ඔවුන්ගේ පාලනය නිසාම ඇති වූ මූල්‍ය අර්බුදය දඩමීමා කරගෙන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සරණ යමිනි. රනිල් වික්‍රමසිංහ දැන් "ආර්ථිකයෙන් රජය මුළුමනින් ඉවත්වීමේ" සංකල්පය ක්‍රියාවට නගමින් සිටී. ඒ, රටට, රටේ ආරක්ෂාවට පවා වැදගත් විදුලිය, තෙල්, ටෙලිකොම් වැනි අවසන් රාජ්‍ය ආයතන ටික විකුණා දැමීමට කටයුතු කරමිනි.

අනෙක් අතට නිදහස් සෞඛ්‍ය සේවය හා නිදහස් අධ්‍යාපනයද ටිකෙන් ටික මියයාමට ඉඩදී සිටින්නේ රජයේ වගකීමෙන් නිදහස්වී ඒවාද ක්‍රමානුකූලව පෞද්ගලික අංශයට ලබාදීම වෙනුවෙනි. 'යන යකා කොරහ බිඳගෙනම යනවා' යයි කියන්නේ ඒ නිසාය.

රනිල් වික්‍රමසිංහට හෝ රාජපක්ෂලාට යළි මේ රටේ බලය ගැනීමට නොහැකි බව ඔවුහු හොඳින් දනිති. පළාත් පාලන මැතිවරණය දිගින් දිගටම කල් දමමින් සිටින්නේ පරාජය අනිවාර්ය බව දන්නා නිසාය. එහෙත් පරාජය කල් දැමුවද ඉන් මිදීමට මෙම පාලක නඩයට නොහැක.

ලබන වසරේ ජනාධිපතිවරණයට මුහුණ දීමට ඔවුන්ට සිදුවේ. එම ජනාධිපතිවරණය මෙරට ඉතිහාසය වෙනස් කරන ඡන්දයක් වනවාට සැක නැත. එහි පරාජය දන්නා පාලක කණ්ඩායම දැන් සිය අවසාන රංගනයන් පෙන්වමින් සිටිති.

ජනතාවගේ සහය යළි නොලැබෙන බව දන්නා ඔවුන් දැන් හැසිරෙන්නේ ජනතාව අමතක කරමිනි. ආණ්ඩුවේ ජනාධිපතිගේ සිට කිසිදු කෙනෙක් රටට ජනතාවට වග වෙන්නේ නැත. ඒ තව දුරටත් ඔවුනට ජනතාව අදාල නොවන නිසාය.

ජනාධිපතිවරයා දැන් වග වෙන්නේ ජනතාවට නොව අධිරාජ්‍යවාදී ආයතනයන්ටය; මූල්‍ය අරමුදලටය. උපයන විට ගෙවීමේ බද්ද දරාගත නොහැකිව එය අඩුකරන ලෙස ඉල්ලා එයද අසාර්ථක වූ විට උගත්තු රට හැර යාමට පටන් ගත්තෝය. එය මෙරට ආර්ථිකයට අධ්‍යාපන, සෞඛ්‍ය, ඉදිකිරීම් වැනි ක්ෂේත්‍රවලට සිදු




කරන හානිය බරපතළය. එලෙස උගතුන් රට හැර යද්දීත් රනිල් සිය බද්ද අඩු නොකරන්නේ මූල්‍ය අරමුදලේ කොන්දේසි ඉටුකිරීම උගතුන් රඳවා ගැනීමට වඩා ලොකු නිසාය.

එසේම අස්වැසුම මගින් සමෘධි ප්‍රතිලාභින් අඩුකිරීම, දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ නාමයෙන් ඊ.පී.එෆ්., ඊ.ටී.එෆ්. අරමුදල්වලට හානි කිරීම, ඒවාට දෙන ප්‍රතිලාභ අඩුකිරීම වැනි පොදු ජනයාට බලපාන තීරණ ගනිමින් සිටින්නේ රනිල් ජනතාවට නොව මූල්‍ය අරමුදලට වගවීමට බැඳී සිටින නිසාය.

ඉන් නොනැවතී බහු ජාතික සමාගම්වලට වාසිදායක වන ලෙස කම්කරු නීති වෙනස් කිරීමට නව පනත් ගෙන ඒමට සූදානම් වීම තුළින් පෙන්වන්නේද රනිල් කොරහත් බිඳගෙනම යාමට සැරසෙන බවය. ත්‍රස්තවාදය වැළැක්වීමේ නව පනතද මේ වර්ගයේම උත්සාහයකි.

රනිල් එසේ කටයුතු කරද්දී ඔහුගේ පොහොට්ටු ඇමති මණ්ඩලය කටයුතු කරන්නේ ඊට නොදෙවෙනි ලෙසය.

රජයේ රෝහල් සඳහා පසුගිය දිනවල ආනයනය කර ඇති බාල ඖෂධ වර්ග නිසා රෝහල් කිහිපයක රෝගීහු කිහිපදෙනෙක්ම මිය ගියහ. බාල ඖෂධ ගෙන්වීම පිටුපස කොමිස් කුට්ටි 'ලබා ගැනීම' තිබෙන බව කවුරුත් දනිති. ඇමතිවරුන් රෝගීන්ගේ ඖෂධවලිනුත් කොමිස් කුට්ටි යටිමඩි ගසන්නේ නම් ඉන් කියවෙන්නේද හොරකමට සීමාවක් නැති බවය. කෙසේ වෙතත් බාල ඖෂධ නිසා රෝගීන් මිය යන බවට චෝදනා එල්ල වූ විට සෞඛ්‍ය ඇමති පාර්ලිමේන්තුවේදී පැවසුවේ රෝහල්වල කොහොමත් රෝගීන් මිය යන බවත් රෝහල් ඉදිරිපිට මල් ශාලා තිබෙන්නේ ඒ නිසා බවත්ය. ඉන් පෙන්වන්නේ ඇමතිවරු ජනතාවට වග නොකියන බවය.

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මනම්පිටිය ප්‍රදේශයේ බස් රථයක් ගඟට පෙරලී මිනිස් ජීවිත 12ක් පමණ නැතිවූ පසු බන්දුල ඇමතිවරයා පැවසුවේ පාලම අලුත්වැඩියා කිරීමට මුදල් නැති බවය. මොවුන් දැන් ජනතාව සමග කෝපයෙන් ජනතාවගෙන් පලිගනිමින් සිටින්නේදැයි කෙනෙකුට සිතෙන්නේ නම් එය සාධාරණය.

මධ්‍යම අධිවේගී මාර්ගය තැනීමේදී එහි තිබූ පඩුකරඳ ගස ආරක්ෂා කිරීමට ජනතාවත්, භික්ෂූන් වහන්සේලාත් ගත් උත්සාහය අවසන් වූයේ බලධාරීන් හොර රහසේම එම ගස උගුල්ලා වල දැමීමෙනි. දැන් අවසානයේ එය ගොඩගැනීමට සිදුව තිබෙන්නේ අධිකරණ නියෝගයක් අනුවය. මේ සියල්ල පවසන්නේ පාලක කල්ලිය දැන් හැසිරෙන්නේ කිසිදු වගකීමකින් තොරව හිතුවක්කාර ලෙසින් බවය. යළි ජනතාවගේ ඡන්දය ගැනීමට සිතන යමෙක් වේ නම් මෙසේ කරන්නේ නැත. එහෙත් දැන් මොවුන් එම බලාපොරොත්තු අත්හැර ඇති බව පෙනේ.

මීට සති කීපයකට පෙර පුත්තලම දිස්ත්‍රික්කයේ අලි සබ්‍රි මන්ත්‍රීවරයා රත්තරන් හා ජංගම දුරකථන රැසක් නීති විරෝධී ලෙස ගෙන ඒමට උත්සාහ කොට ගුවන්තොටුපළ බලධාරීන්ට අසු වූ අවස්ථාවේ සිදුවූයේ කුමක්ද? ඔහුට අවම දඩයක් (රු. ලක්ෂ 75ක්) නියම කොට මුදාහැරීමය. ඔහු පසුදාම පාර්ලිමේන්තුවටද පැමිණි අතර එම නීතිවිරෝධී ජාවාරම ගැන කිසිදු ලජ්ජාවක් ඔහුට තිබුණේ නැත. ආණ්ඩුව ඔහු වෙනුවෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් මෙතෙක් ගත්තේද නැත.

මේ වන විට ලංකාවේ සියලුම රාජ්‍ය ආයතන අරාජික වී තිබේ. ඒවා අරමුණකට මෙහෙය වෙන්නේ නැත. ආණ්ඩුවේ සියලු දෙනා තම තමන්ට හැකි ආකාරයෙන් තම තමන්ගේ බලය අනුව මුදල් සෙවීමත්, ජීවිතයට 'සැප ගැනීමත්' කරමින් සිටිති. ඊටම සරිලන නිලධාරීහු කිහිපදෙනෙක්ද සිටිති.

පිටි ආනයනය නවත්වා, ලංකාවේ ප්‍රීමා හා සෙරන්ඩිබ් යන බහුජාතික සමාගම් දෙකට තිරිඟු පිටි ඒකාධිකාරය ලබාදී පිටිවලින් අධික ලාභයක් ලබා ගැනීමට සැලැස්වීම තුළද ඇත්තේ ඉහත කරුණුමය.

මේ සියල්ල කියා පාන්නේ පාලකයින් දැන් යළි බලයට පත්වීම වෙනුවට බලයේ සිටින කෙටි කාලය හම්බකිරීමට කැපකර ඇති බවය; ජනතාවට, රටට වග නොකියන බවය. පාලක කල්ලියක් අපේක්ෂාභංගත්වයට පත්වූ විට හැසිරෙන්නේ මේ ආකාරයෙන්මය. ඔවුහු බියවී සිටිති. කෝපයට පත්ව සිටිති. කලබල වී සිටිති. බලය අත්හැරීමට සිදු වන බව සිතෙන විට වියරු වැටෙමින් සිටිති. අවලාද, අපහාස, බොරු බේගල් දමා ගසා ජනතා බලවේග දුර්වල කිරීමට විවිධ උත්සාහ ගනිති. ඒ සියල්ල තුළම ගැබ්ව ඇත්තේ ඔවුන්ගේ පරාජයේ සලකුණුය.

මේ තත්වය තේරුම් ගෙන මේ දුෂ්ට පාලක කල්ලියේ අවසානය සනිටුහන් කිරීම සඳහා තමන්ගේ සැබෑ සතුරන්, සැබෑ මිතුරන් හඳුනාගෙන අවබෝධයෙන්, විශ්වාසයෙන් හා අවධානයෙන් කටයුතු කිරීම ජනතාවගේ වගකීම වේ.






# යථාර්ථයට මුහුණදීම, යටත් වීමද?

"රනිල් ආර්ථිකය ගොඩදානවා නේද?"

"නැහැ රනිල් ආර්ථිකයට බලහත්කාරී, කෘත්‍රිම මැදිහත්වීමක් කරමින් ඉන්නවා."

"එතකොට?"

"එතකොට වෙන්නෙ යථාර්ථයට මුහුණදෙන්න සිද්ධ වුණාම ආයෙත් ආර්ථිකය වේගෙන් පල්ලෙහටම යන එක."

අපේ රටේ ඩොලර් සංචිත ගොඩනැගීම, ඒ මගින් රුපියල ශක්තිමත් කරමින් ආර්ථිකය වර්ධනය වෙමින් යථා තත්වයට පත්වෙන බව කියමින් රටත්, ජනතාවත් රැවටීම රනිල් ඇතුළු මේ අසමත් ධනවාදයේ උපාය බවට පත්ව ඇත. නමුත් ඩොලර් සංචිත ගොඩනැගීම වෙනුවෙන් ආණ්ඩුව ණය ගෙවීම පැහැර හැරියේය. එය දැන් ඩොලර් මිලියන 6000ක ආසන්නයක් දක්වා ගොඩගැසී ඇත. එසේම නැවත ඩොලර් පොලියට ගත්තේය. අයි.එම්.එෆ්. එකෙන් ඩොලර් මිලියන 2900ක් ගන්නට යන්නේ පොලියටය. එසේම වසරක පමණ කාලයක් ආනයන සීමා කර බලහත්කාරී ලෙස ඩොලර් රඳවා ගත්තේය.

මෙම බලහත්කාරී හා කෘත්‍රිම මැදිහත්වීම හැමදාම කිරීමට ධනවාදයට නොහැක. දැන් යථාර්ථයට මුහුණදීමට ආණ්ඩුවට සිදු වී ඇත. එනයින් ආනයන සීමා ඉවත් කිරීමට ඔවුන්ට සිදුව තිබේ. හිර කරගෙන ඇති ණය ගෙවීම ඉක්මණින්ම ආරම්භ කිරීමට අකමැත්තෙන් හෝ සිදුව ඇත. ඒ නිසාම බලහත්කාරී ලෙස රැස්කර ගත් ඩොලර් නිදහස් කිරීමටද සිදු වී ඇත. මෙම තත්වය නිසා ආණ්ඩුවට නව ක්‍රියාමාර්ග වෙත යොමු වීමට සිදු වී ඇත.

ඒ අනුව රනිල් ඉන්දියාව බලා පිටත් වන්නේ රටේ ආර්ථිකය හා දේශපාලන ස්වාධීනත්වය, රට උකසට තබමින් පිළිසරණක් බලාපොරොත්තුවෙනි. එහිදී ඉතාම අවසිදායක ගිවිසුම් හතරක් සඳහා ඔහු අත්සන් තබන්නේ, ඉන්දියානු අධිරාජ්‍යවාදී මැදිහත්වීමට ඉඩකඩ විවර කරමිනි.

අපේ රට දුර්වල වන සෑම අවස්ථාවක්ම අධිරාජ්‍යවාදීහු තම වුවමානාවන් ඉටුකරගැනීම වෙනුවෙන් ක්‍රියාත්මක වෙති. ප්‍රංශ ජනපති පැය තුනකට ලංකාවට එන්නේ තම අයිතිය මතක් කිරීමටය. ජපන් විදෙස් ඇමතිවරයා ලහි ලහියේ එන්නේ තම කොටහ බේරාගනිමින් ණය උගුලේ අප තව තවත් හිර කරගැනීමටය. අයි.එම්.එෆ්. මගින් ඇමරිකානු වුවමනාව ක්‍රියාත්මක වන්නේද ඒ අනුවය. ලෝක දේශපාලනයේ බල ගැටුමට අනුව අනෙක් පසින් චීන දූත මණ්ඩලයක්ම ලංකාවට එන්නේ තමන්ගේ අයිතිය නොකඩවා පත්වාගෙන යාමේ වුවමනාව පෙරදැරිවය.

අසමත් රනිල් රාජපක්ෂ ප්‍රමුඛ ලාංකේය ධනවාදයට මෙම අර්බුදයෙයෙන් ගොඩවීමට දැන් ඇති විසඳුම බවට පත්ව ඇත්තේ යටත් වීම පමණි; අධිරාජ්‍යවාදයේ, යළි යටත්විජිතකරණ උපායමාර්ගයේ ගොදුරු බවට පත් වී ඇති අපේ රට තව තවත් එම උපායමාර්ගයේම ඉදිරියට ගමන් කරවීම පමණි. මේ වේගවත් මැදිහත්වීම් හා ක්‍රියාමාර්ග හමුවේ පෙන්නුම් කරන්නේ අන් යමක් නොව එයම පමණකි.

මේ නිසා රටක් ලෙස අධිරාජ්‍යවාදීන්ගේ යළි යටත්විජිතකරණ උපායමාර්ගයේ ගොදුරු බවට පත් වීමට ඉඩ නොදී, නව පන්නයේ අධිරාජ්‍යවිරෝධී අරගලයක් වෙනුවෙන් සංවිධානය කිරීම, දැනුවත් වීම කාලෝචිත වන්නේය.

# සටනක පෙරමග

සියවස් පුරා හඬමින්
පෘථිවි තල දෙදරා
යනු තරම් දෙවමින්
සෝ තැවුල්
අසාර්ථක ලොවක්
පිරිහුණු ලොවක්
මහත් උස් හඬින්
කියා පෑ උමතුව..
ධනවාදයේ පියවරැනි..
නුඹලා සුරැකි ධනයත්
අපට හිමි හැමදෙත්
හිමිකර මිසක නැවතත්
පසු නොහැරෙයි කිසිවෙක්..
අපට අහිමිය ඵලය
අප විසින් නිමැයූ ඵලය
අපෙන් උදුරා ගත්
දහදිය පෙඟෙන
මහා ස්කන්ධ
කඳුළින් දියවන ජීවිත
දිනෙන් දින ගෙවා
සියවස් පුරා..
හැම සත දුකින් මුදවන
මහා බල පරාක්‍රමයක්
අවැසිය
දනන් අවදිකොට සටනට
ප්‍රේමයද මුවහත් කොට
රැගෙන සුරතින්...



# ජාතික භෞතික සැලැස්ම පරිසර ඝාතකයන්ගේ මෙහෙයුමක්ද?



"ජාතික භෞතික සැලැස්ම පරිසර ඝාතකයන්ගේ මෙහෙයුමක්ද?" යන මැයෙන් සමාජවාදී තරුණ සංගමය සහ පරිසර සංවිධාන එකතුව විසින් පසුගිය ජුලි 26 වන දින කොළඹ මහජන පුස්තකාල පරිශ්‍රයේ දී සම්මන්ත්‍රණයක් පවත්වනු ලැබීය. 2011 ආරම්භ කළ ජාතික භෞතික සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී රටේ වටිනා පරිසර පද්ධති හා ජන ජීවිත විශාල තර්ජනයට ලක්වෙමින් ඇත. ආර්ථිකය නගා සිටුවීම අරමුණු කරගනිමින් ඇරඹූ මෙම ව්‍යාපෘතිය මගින් රටේ ආර්ථිකයට ලැබෙන ප්‍රතිලාභයට වඩා බහු ජාතික සමාගම්වලට ලාබ ලැබිය හැකි ව්‍යාපෘතියක් බවට පත්ව ඇත. මෙම සැලසුමේ ඉදිරි ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළහොත් අවුරුදු මිලියන ගණනකින් නිර්මාණය වූ අපේ පරිසර පද්ධති බොහෝමයක් තර්ජනයට ලක්වීමේ ඉඩකඩ ඇති බවත් මෙය දේශපාලකයන්ගේ සාක්කු පිරෙන ව්‍යාපෘතියක් බවත් එම සම්මන්ත්‍රණයේදී අදහස් දැක්වූ විද්වත්හු පැවසූහ.


මෙම සම්මන්ත්‍රණයේදී පරිසරවේදී රවීන්ද්‍ර ආචාර්ය කාරියවසම්, නීතීඥ ලක්මාලී හේමචන්ද්‍ර, සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර, නීතීඥ චරිත් ගල්හේන යන අය අදහස් දැක්වූහ. රංගන ශිල්පී ජනක රණසිංහ, සමාජවාදී තරුණ සංගමයේ ජාතික කමිටු සාමාජික මලින්ද ජීවන්, සමාජ ක්‍රියාකාරී කාංචනා වේවැල්පනා යන සහෝදර සහෝදරියෝ මෙහි මුලසුන හෙබවූහ. මෙහිදී ගාමිණී හත්තෙට්ටුවේගම විවෘත වීදි නාට්‍ය කණ්ඩායම විසින් ගීතමය වැඩසටහන්ද පවත්වනු ලැබීය.

# ජාතික සමඟි පාගමනට රනිල් රාජපක්ෂගෙන් පොලිස් ප්‍රහාරයක්



"බෙදන්නට ඉඩ නොදෙමු! එක්ව අපි පියාඹමු!" මැයෙන් මෙවර සහෝදරත්වයේ දිනය වෙනුවෙන් වැඩසටහන් රාශියක් සමාජවාදී තරුණ සංගමය ලෙස සංවිධානය කරන ලදී . ජුලි 12 සිට ජුලි 27 දක්වා මාතලේ, වව්නියාව, යාපනය, මඩකලපුව, ත්‍රිකුණාමලය, පුත්තලම හා මහනුවර යන දිස්ත්‍රික්වල උද්ඝෝෂණ, පාගමන්, ගම්මාන වැඩසටහන් අත්පත්‍රිකා බෙදීම් ආදි දැනුවත් කිරීම් සිදු කෙරිණි. මෙවර සහෝදරත්වයේ දින ප්‍රධාන වැඩසටහන ජුලි 23 විහාරමහාදේවී උද්‍යානයේ දී පැවැත්විණි. හයිඩ් පිටියේ සිට පාගමනින් පැමිණ සංස්කෘතික වැඩසටහනට පැවැත්වීමට සූදානම් කරන ලදී. පාගමන ආරම්භ කිරීමට පෙර පොලීසිය විසින් දිගින් දිගටම බාධා කළ අතර පසුව ලිප්ටන් වටරවුමේදී උද්ඝෝෂණයකින් අනතුරුව පාගමන ආරම්භ කෙරිණි. යළිත් පෙළපාලියට බාදා කරමින් රනිල් රාජපක්ෂ ආණ්ඩුවේ පොලීසිය විසින් ජාතික සමගි පාගමනට ප්‍රහාර එල්ල කරන ලදී. අනතුරුව විහාරමහදේවී උද්‍යානයේදී සංස්කෘතික වැඩසටහන ආරම්භ කෙරිණි. මෙහිදී ප්‍රධාන දේශනය ජවිපෙ ජාතික සංවිධායක බිමල් රත්නායක සහෝදරයා විසින් පැවැත් වූ අතර මේ සඳහා සිවිල් සංවිධාන නියෝජිතයින්, බහුආගමික නායකයින්, විද්වතුන් හා කලාකරුවන් විශාල ප්‍රමාණයක් සහභාගි වූහ.

# මොන්කාඩා ප්‍රහාරයට වසර 70යි



කියුබානු විප්ලවයේ, අතීත පාඩම් රැසකට පාදක වූ මොන්කාඩා ප්‍රහාරය සිදුව වසර 70ක් පිරීම නිමිත්තෙන් පසුගිය ජුලි 22 දින සම්මන්ත්‍රණයක් කියුබානු මිතුරෝ සංවිධානය විසින් මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේ පවත්වනු ලැබීය. එය කියුබානු තානාපති ඇන්ඩ්‍රියස් මාර්සෙලෝ ගොන්සාලෙස් සහෝදරයාගේ සහභාගිත්වයෙන් පැවැති අතර එම අවස්ථාවට සමාජවාදී තරුණ සංගමය නියෝජනය කරමින් කල්පනා මධුභාෂිනී සහෝදරිය වත්මන් කියුබාවේ තත්වය සම්බන්ධයෙන් අදහස් දක්වා දැක්වූවාය. මෙම අවස්ථාවට තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා හා ජාත්‍යන්තර කටයුතු ලේකම් අංජන අමරසිංහ සහෝදරයාද සහභාගි වූහ.

# ජුලි 09 ජනතා නැගිටීමට වසරයි




2022 වසරේ ජුලි 09 ලාංකේය ජනතාවට ඓතිහාසික අවස්ථාවක් විය. පුරා මාස 03ක කාලයක් නොනවත්වා පැවැති ගාලු මුවදොර අරගලය අවසන් වූයේ ලාංකේය ඉතිහාසය තුළ ප්‍රථම වරට විධායක ජනාධිපතිවරයෙක් ජනතාව විසින් පන්නා දැමීමෙනුයි. වසර ගණනාවක් ගොවි, ගුරු, කම්කරු, හා වාමාංශික දේශපාලන පක්ෂ ආදිය විසින් පැවැත්වූ අරගලයන්ගේ තීරණාත්මක අවස්ථාවක් වූයේ බහුතර ජනතාවක් එක්තැනක අරගල භූමියක් බවට ගාලුමුවදොර අරගලය පත්කර ගැනීමය. එම අරගලය තුළ යම් ජයග්‍රහණයක් ලැබූවද නිවැරදි දේශපාලන දිශානතියකට යොමු නොවීම හේතුවෙන් අවසන් ජනතා ජයග්‍රහණයක් බවට පත්කරගැනීමට නොහැකි විය. එම නිසාම "ජනතා නැගිටීමට වසරයි! ජනතාවාදී ජයග්‍රහණය තෙක් ජන සටන පෙරට!" තේමාව කරගනිමින් එම අවස්ථාව සැමරීම සඳහා සමාජවාදී තරුණ සංගමය පසුගිය ජුලි 09 දින දියත උයනේදී විරෝධතාවක් සංවිධානය කළේය. මේ සඳහා සිවිල් සහ බහුජන සංවිධාන ඇතුළු සමාජ ක්‍රියාකාරීහු, සිවිල් ක්‍රියාකාරීහු රැසක් එක්ව සිටියහ.

## උඩුගුවනේ දිස්වූ දේදුන්න







සොබාදහමේ තවත් අපූරු නිර්මාණයක් වන සම්පූර්ණ දේදුන්නක් දකින්නට ලැබෙන්නේ ඉතාමත් දුර්ලභ අවස්ථාවකදීය. මේ අවස්ථාව ඡායාරූපයට නගා ඇත්තේ ගුවන් නියමු ලොයිඩ්ට ජේ.ෆෙරාරෝ විසින් අඩි 30,000ක් ඉහළ උඩු ගුවනේ සිටය. සම්පූර්ණ දේදුන්නක් යනු සම්පූර්ණ කවයකි. පෘථිවියේ සිට බලන අයකුට බොහෝවිට දැකගත හැකි වන්නේ දේදුන්නෙන් හරි අඩකි. මේ දුර්ලභ දර්ශනය දැකගත හැකි වන්නේ ගුවන් යානයක සිට නිවැරදි කාලගුණ තත්වයන් යටතේ පමණි.

## රේඩියෝ තරංග නිකුත් කරන තාරකාව



ස්පන්දනය වෙමින් රේඩියෝ තරංග නිකුත් කරන නව තාරකා වස්තුවක් ඕස්ට්‍රේලියාවේ Curtin විශ්වවිද්‍යාලයේ තාරකා විද්‍යාඥයන් පිරිසක් විසින් සොයා ගෙන ඇත. පෘථිවියේ සිට ආලෝක වර්ෂ 15,000ක් දුරින් පිහිටි මෙම තාරකාව Scutum තාරකා මණ්ඩලයේ පිහිටා ඇති බව සොයාගෙන ඇති අතර මෙය සෑම විනාඩි 22කට වරක්ම තත්පර 30ක සිට මිනිත්තු 05දක්වා කාලයක් ස්පන්දනය වෙමින් රේඩියෝ තරංග නිකුත් කරන බවයි තාරකා විද්‍යාඥයන් පවසන්නේ. 2018 වර්ෂයේ මෙම විද්‍යාඥයන් විසින් පැයකට තුන් වතාවක් විශාල ශක්තියක් විමෝචනය කරන සහ විකිරණ නිකුත් කරන, කැරකෙන ආකාශ වස්තුවක් නිරීක්ෂණය කරනු ලැබීය. ඒ ඔස්සේ වැඩිදුරටත් සිදුකරන පරීක්ෂණ හා නිරීක්ෂණ අනුව මෙම අසාමාන්‍ය තාරකා වස්තුව සොයාගෙන ඇතැයි විදෙස් මාධ්‍ය වාර්තා කරයි.

## චීනය හඳේ ගඩොල් තනයි



චීනයේ වූහාන් නගරයේහිදී අභ්‍යවකාශ පරීක්ෂකයෝ හා අභ්‍යවකාශ ගවේශකයෝ හඳෙහි පස් යොදා ගෙන ගඩොල් තනා හඳ මත පරීක්ෂණ මධ්‍යස්ථානයක් තැනීමට සැලසුම් කරති. අභ්‍යවකාශ කොන්ත්‍රාත්කරුවන් සියයකට වැඩි පිරිසක් මෙම සාකච්ඡාවට සහභාගි වී ඇත. චීන ජාතික ඉංජිනේරු ආයතනයේ විශේෂඥයකු වන ඩික් ලියුං හඳ මත චන්ද්‍ර පාෂාණ යොදා ගෙන ගඩොල් තැනීම සඳහා චයිනීස් සුපර් මේසන්ස් නමින් රොබෝවරයෙක් නිර්මාණය කිරීමටත් සාකච්ඡා වූ බව ජාත්‍යන්තර මාධ්‍ය ප්‍රකාශ කරයි. අනාගතයේ දී මෙම ඉලක්කය නිශ්චිතවම ළඟා කර ගැනීමට හැකි බව එම විද්‍යාඥයින් විසින් පවසා ඇත. චීනයේ අරමුණ වනුයේ ඉදිරි දශක කිහිපය තුළ හඳෙහි යටිතල පහසුකම් දියුණු කිරීමටයි. 2028 වසර වන විට හඳෙහි පස්වලින් ගඩොල් තැනීමට ඔවුහු අපේකෂා කරති. 2025 වසර තුළ හඳට පිටුපා ඇති ප්‍රදේශයෙන් පස් සාම්පල රැගෙන ඒමට සැලසුම් කර ඇති බවද සඳහන්ය.

# ආණ්ඩුවේ වුවමනාවට EPF/ ETF අරමුදල් කප්පාදු වන හැටි

1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනත මගින් ස්ථාපිත කර ඇති සේවක අර්ථ සාධක අරමුදල පෞද්ගලික අංශයේ, අර්ධ රාජ්‍ය අංශයේ සේවක සේවිකාවන් විශ්‍රාම ගිය පසු ඔවුන්ගේ අනාගත සුරක්ෂිතතාවය සඳහා ස්ථාපිත කරන ලද්දකි. මෙම පනත අනුව අරමුදලේ සාමාන්‍ය පරිපාලනය කම්කරු කොමසාරිස්වරයා වෙත පැවරී ඇති අතර අරමුදල් කළමනාකරණය සඳහා වූ සියලු බලතල, කාර්යයන් හා වගකීම් අරමුදල් භාරකරු වන ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙත පැවරී ඇත.

මෙම අරමුදලට මාසිකව සේවකයා සිය වැටුපෙන් 08% ක දායකත්වයක් දක්වන අතර සේවා යෝජකයා සේවකයාගේ වැටුපෙන් 12% ක් ලෙස මෙම අරමුදලට දායකත්වය දෙනු ලබයි.

2022 දෙසැම්බර් 31 දින වන විට මෙම අරමුදලේ සක්‍රීය ගිණුම් හිමියන් ලක්ෂ 24ක්ද අක්‍රීය ගිණුම් හිමියන් මිලියන 18කින් සමන්විතය. එසේම EPF අරමුදලට දායකත්වය ලබාදෙන සේවායෝජකයන් සංඛ්‍යාව 67,500ක් පමණ වේ. මෙම අරමුදල රුපියල් බිලියන 3460ක අරමුදලකින් සමන්විත වේ. මෙම අරමුදලෙන් ආණ්ඩුව 97%ක් එනම් රුපියල් බිලියන 3380ක් භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර මගින් ණය ලෙස ලබාගෙන ඇත.

එසේම සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට (ETF) මාසිකව සේවකයාගේ මුළු ඉපැයුම්වලින් 03%කට සමාන මුදලක් සේවා යෝජකයා විසින් මෙම අරමුදලට ගෙවනු ලබයි. 2022 දෙසැම්බර් 31 දින වන විට ETF ගිණුමේ රුපියල් බිලියන 460ක මුදලක් තිබූ අතර ඉන් 99% ක්ම එනම් රුපියල් බිලියන 457ක්ම ආණ්ඩුව භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර මගින් ණය ලෙස ලබාගෙන තිබේ.

රජය මගින් ඉදිරිපත් කර තිබෙන දේශීය ණය ප්‍රශස්තකරණ ක්‍රියාවලියේදී සෘජුවම බලපෑමකට ලක්වන්නේ මෙම EPF හා ETF අරමුදල් ද්විත්වයයි. මෙහිදී EPF හා ETF අරමුදල්වල ඇති රුපියල් බිලියන 3500ක් පමණ ආයෝජනය කර ඇති භාණ්ඩාගාර බැඳුම්කරවලට ගෙවීමට යෝජිත ඉහළ පොළී අනුපාතිකයන් වෙනුවට 2023 සිට 2038 දක්වා වසර 16ක කාල සීමාවන් සඳහා මෙම අරමුදල් වලට 09.1% ක වාර්ෂික පොළී අනුපාත සාමාන්‍යයක් ගෙවීමට ආණ්ඩුව විසින් යෝජනා කර තිබේ.

එයට එකඟ නොවන්නේ නම් දැනට මෙම අරමුදල්වල ආයෝජනයන් වෙනුවෙන් ලැබෙන ආදායමට පනවා ඇති 14%ක බද්ද 30% දක්වා වැඩි කිරීමට ආණ්ඩුව විසින් යෝජනා කර තිබේ. එසේ වුවහොත් රජයේම දත්තයන්ට අනුව මෙලෙස ප්‍රශස්තකරණයට ලක්වන 117ක් පමණ වන superannuation අරමුදල්වලට 2023 - 2038 දක්වා වසරවලට ලැබෙන පොළී අනුපාතයේ සාමාන්‍ය වනුයේ 7.7% ක් පමණි.

ආණ්ඩුව මේ අනුව මෙම අරමුදල් කෙසේ හෝ ප්‍රශස්තකරණ ක්‍රියාවලියට හසුකිරීමේ ක්‍රියාවලියක නිරතව සිටින බව පෙනෙන්නට තිබේ. මෙහිදී පසුගිය වසරේ EPF අරමුදල් දත්ත අධ්‍යයනය කිරීමේදී පැහැදිලි වන එක් කරුණක් තිබේ. එනම් මෙම ප්‍රශස්ථකරණය සිදු කළහොත් EPF ගිණුම් හිමියාට නිසැකවම ඔහුගේ EPF ගිණුමට වසරකට ලැබෙන පොළිය 7% කට වඩා අඩු අගයක් ගන්නා බවයි. මන්ද දැනටමත් EPF අරමුදල ලැබෙන සියලුම පොළී හා ආයෝජන ආදායම මත 14%ක බද්දක් පනවා ඇති නිසා හා EPF අරමුදලේ මෙහෙයුම් කටයුතු සඳහාද ගිය වසරේ පමණක් රුපියල් බිලියන 1.4ක මුදලක් වැයවී ඇති නිසාය. මේ අනුව EPF අරමුදලේ වාර්ෂික ආයෝජන ආදායම්වලට ඇති බද්ද හා මෙහෙයුම් වියදම් අඩු කළ පසු EPF ගිණුම් හිමියාට ලැබෙන පොලිය 7%ට වඩා අඩු අගයක් ඉදිරි 2023-2038 කාලපරිච්ඡේදය සඳහා ලැබෙන බව පැහැදිලිය.

පහත EPF අරමුදලේ අවසන් වසර පහක මූල්‍ය වාර්තා තොරතුරු අධ්‍යනය කිරීමේදී ඔබට ඒ බව මනාව

පසුගිය වසර 5 මූල්‍ය වාර්තා සාරාංශය

| | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|---|
| අරමුදලේ සමස්ත වටිනාකම (බිලියන) | 2289 | 2540 | 2824 | 3166 | 3460 |
| සාමාජිකයන් සඳහා වන සමස්ත වගකීම (බිලියන) | 2254 | 2497 | 2768 | 3067 | 3381 |
| මුළු සාමාජික ගිණුම් සංඛ්‍යාව (මිලියන) | 18.7 | 19.4 | 19.8 | 20.3 | 20.4 |
| සක්‍රීය ගිණුම් (දැනට දායක මුදල් එවනු ලබන ගිණුම්) මිලියන | 2.9 | 2.9 | 2.6 | 2.5 | 2.4 |
| අක්‍රීය ගිණුම් (දැනට දායක මුදල් එවනු නොලබන ගිණුම්) මිලියන | 15.8 | 16.5 | 17.2 | 17.8 | 18 |
| මුළු දායක ලැබීම් (බිලියන) | 145 | 157 | 151 | 166 | 194 |
| මුළු දායක ගෙවීම් (බිලියන) | 108 | 126 | 110 | 118 | 163 |
| ශුද්ධ දායක මුදල් (බිලියන) | 37 | 31 | 41 | 47 | 32 |
| සාමාජික ගිණුම්වලට ගෙවූ පොලිය | 9'5] | 9'25] | 9] | 9] | 9] |
| ආයෝජන ආදායම (බිලියන) | 201 | 259 | 285 | 342 | 316 |
| සාමාජික ගිණුම්වලට බෙදාහල ආයෝජන ආදායම (බිලියන) | 194 | 210 | 227 | 252 | 277 |

පැහැදිලි වේ.

එසේම පසුගිය වසර දහය තුළ උද්ධමනයට සාපේක්ෂව සාමාජික ගිණුම්වලට ලැබුණු පොලිය හා සාමාජික ශේෂණ මූර්ත සඵල ප්‍රතිඵල බැංකුවේ අර්ථසාධක වාර්ෂික වාර්තාව අනුව අනුපාතික පහතින් දක්වා තිබේ.

| වසර | ලබාදුන් පොලිය | සාමාන්‍ය වාර්ෂික උද්ධමනය | සාමාජික ශේෂය මත මූර්ත සඵල ප්‍රතිලාභ අනුපාතය |
|---|---|---|---|
| 2012 | 11.62 | 7.6 | 3.74 |
| 2013 | 11.14 | 6.9 | 3.84 |
| 2014 | 10.60 | 3.3 | 7.07 |
| 2015 | 10.57 | 0.9 | 9.58 |
| 2016 | 10.51 | 4 | 6.51 |
| 2017 | 10.51 | 6.6 | 3.91 |
| 2018 | 9.57 | 4.3 | 5.24 |
| 2019 | 9.21 | 4.3 | 4.97 |
| 2020 | 9.02 | 4.6 | 4.42 |
| 2021 | 9 | 6.9 | 2.1 |
| 2022 | 9 | 50 | -41 |

ඒ අනුව ඉහත දත්ත සලකා බැලීමේදී 2018-2021 කාලසීමාව දක්වා උද්ධමන සාමාන්‍ය 5%ක් පමණ වූ අතර 2022 වර්ෂයේදී උද්ධමනය අප රටේ වාර්තා වූ වැඩිම උද්ධමන අනුපාතය වාර්තා වුණි. (ජාතික පාරිභෝගික මිල දර්ශකය (NCPI) අනුව 50%)

ඒ අනුව ගිය වසරේ උද්ධමනයේ ප්‍රතිඵලය මත අපගේ EPF හා ETF අරමුදල්වල වටිනාකම විශාල ලෙස අඩුවී තිබේ. ඒ අනුව රුපියල් ලක්ෂ 10ක් පමණ අරමුදලක් ඇති කෙනෙකුගේ EPF අරමුදලේ වටිනාකමක අධි උද්ධමන තත්වය හේතුකොටගෙන රුපියල් ලක්ෂ 6ක් පමණ දක්වා අඩු වී තිබේ. එසේම ගිය වසරේ භාණ්ඩාගාර බැඳුම්කර සඳහා ගෙවූ කූපන් අනුපාතයේ සාමාන්‍ය 18% ක් පමණ වූ අතර භාණ්ඩාගාර බැඳුම්කර ද්විතික වෙළඳපොලේ විකිණිය හැකි අනුපාතයේ (Yield Rate) සාමාන්‍යය 22%ක් පමණ විය. සාමාන්‍යයෙන් 2021 වසරේ භාණ්ඩාගාර බැඳුම්කරවල කූපන් අනුපාතයේ සාමාන්‍ය 10%ක් පමණ වූ අතර yield අනුපාතයේ සාමාන්‍ය 12%ක් පමණ විය. ආණ්ඩුව දැන් කිරීමට යන්නේ 2022 වර්ෂයේ ඉතා ඉහළ පොළී අනුපාතයකට ආයෝජනය කර ඇති මුළු භාණ්ඩාගාර




**දැනට අරමුදලේ රුපියල් ලක්ෂ 10ක් ඇති අයකුට මෙමගින් ඇතිවන පාඩුව වසරකට රු. 103,000ක් පමණ වේ. එසේම මෙමගින් සමස්ත අරමුදලට වසර 16 තුළ අත්වන පාඩුව ට්‍රිලියන 06කට අධිකය. මෙම දත්ත අනුව පෙනී යන්නේ EPF අරමුදලේ පැවැත්ම අනාගතයේ දැඩි බලපෑමකට ලක්වන බවය. ලැබිය යුතු පොලිය නොලැබීම නිසා අරමුලේ සාමාජිකයන්ට පෞද්ගලිකව පාඩු විඳීමට සිදු වන බවය. මේ තත්වය තුළ වැඩකරන ජනතාව එක්ව මෙය නිසැකවම පරාජය කළ යුතුමය.**

බැඳුම්කර ප්‍රමාණය එනම් රුපියල් බිලියන 3184ක් බැඳුම්කර අහෝසි කර ඒ සඳහා අලුත් බැඳුම්කර නිකුත් කිරීමටය. එම බැඳුම්කරවලට ගෙවීමට යෝජනා කර ඇත්තේ 2023-2025 වර්ෂ සඳහා 12% කූපන් අනුපාතයක් වන අතර 2026-2038 දක්වා 09% කූපන් අනුපාතයයි. මෙම නව බැඳුම්කර මගින් EPF අරමුදලට 2023-2038 කාලසීමාවට ලැබෙන වාර්ෂික පොලියේ සාමාන්‍යය වන්නේ 09%කි. එසේ නම් ආණ්ඩුව 2022 වසරේ ඉහළ අනුපාතවලට අයෝජනය කර ඇති බැඳුම්කර අහෝසි කිරීම මගිනුත් 2022 වර්ෂයේ උද්ධමනය (50%ක් පමණ) නිසා EPF ගිණුම්වලට වූ බලපෑම නිසාත් නිසැකවම ඉදිරි වසරවලදී ලැබීමට හිමි EPF පොලිය මෙවර කප්පාදුවකට ලක් වනු නිසැකය.

දැනට අරමුදලේ රුපියල් ලක්ෂ 10ක් ඇති අයකුට මෙමගින් ඇතිවන පාඩුව වසරකට රු. 103,000ක් පමණ වේ. එසේම මෙමගින් සමස්ත අරමුදලට වසර 16 තුළ අත්වන පාඩුව ට්‍රිලියන 06කට අධිකය. මෙම දත්ත අනුව පෙනී යන්නේ EPF අරමුදලේ පැවැත්ම අනාගතයේ දැඩි බලපෑමකට ලක්වන බවය. ලැබිය යුතු පොලිය නොලැබීම නිසා අරමුලේ සාමාජිකයන්ට පෞද්ගලිකව පාඩු විඳීමට සිදු වන බවය. මේ තත්වය තුළ වැඩකරන ජනතාව එක්ව මෙය නිසැකවම පරාජය කළ යුතුමය.

EPF අරමුදල් හා ETF අරමුදල යනු විශ්‍රාම වැටුපකට හිමිකමක් නොමැති අර්ධ රාජ්‍ය, පෞද්ගලික අංශයේ සියලුම සේවක සේවිකාවන් විශ්‍රාම යන විට ඔවුන්ගේ විශ්‍රාම දිවිය පවත්වාගෙන යෑම සඳහා ස්ථාපිත කරන ලද අරමුදල්ය. මෙම දේශීය ණය ප්‍රශස්තකරණ ක්‍රියාවලිය මගින් කප්පාදු වන්නේ ඔවුන්ගේ විශ්‍රාම දිවියෙන් පසු කිරීමට බලාපොරොත්තු වන සිහිනයන්ය. මෙම කප්පාදුවට ඉඩදුනහොත් විශ්‍රාමිකයෙකුට ඔබට ලැබෙන EPF/ETF මුදල්වලින් ඔහු හෝ ඇයි බලාපොරොත්තු වන කාර්යයන් සිදුකරගත නොහැකි වනු ඇත. මන්ද 2022.12.31 දිනට රුපියල් බිලියන 30,200ක් මේ රට ණය කර ඇති වසර 75ක පාලකයන් දිගටම බලයේ සිටියහොත් මෙම අරමුදලේ පැවැත්ම මෙන්ම තව තවත් උද්ධමනය වැඩිවී අරමුදලට වන හානිය ගණනය කළ නොහැකි තරම් වන නිසාය. එසේම මෙම අරමුදල් කප්පාදුවට අනුමැතිය ලබාදෙන අදාළ වගකිවයුතු සියලු නිලධාරීන්ටද අනාගතයේ මෙම කප්පාදුව සම්බන්ධයෙන් ජනතාවට වගකීමට සිදුවනු ඇත.

# නව බල කඳවුරක් ලෙස ගොඩනැගෙන BRICS




ප්‍රහලොස්වන BRICS සමුළුව දකුණු අප්‍රිකාවේ ජොහැන්නස්බර්ග්හිදී මෙම අගෝස්තු මාසයේදී පැවැත්වීමට කටයුතු සූදානම් කර තිබේ. එය එම රටවල රාජ්‍ය නායකයින්ගේ සහභාගිත්වයෙන් පැවැත්වෙන්නේ වසර හතරකට පසුවයි. කොවිඩ් වසංගතය හේතුවෙන් එය එතෙක් පවත්වන ලද්දේ මාර්ගගත ආකාරයට, රුසියාවේ සභාපතිත්වයෙනි.

මෙවර සමුළුවේදී ලෝකය තුළ බහුපාර්ශවීයත්වය ගොඩනැගීම, දේශගුණික විපර්යාස, ත්‍රස්තවාදය ඇතුළු ගෝලීය අභියෝගවලට මුහුණ දීම යන කරුණුවලට අමතරව සංවිධානයට නව සාමාජිකයින් ඇතුළත් කරගැනීම, ලෝක ආර්ථිකයේදී හා වෙළඳාමේදී ඩොලරය මගහැර යාම සඳහා BRICS මුදල් ඒකකයක් හඳුන්වා දීම යන කරුණු විශේෂයෙන් සාකච්ඡා කිරීමට නියමිතය.

## BRICS ආරම්භය

බ්‍රසීලය, රුසියාව, ඉන්දියාව හා චීනය හැඳින්වීමට කෙටි නමක් ලෙස 'BRIC' යන යෙදුම පළමු වරට භාවිතා කරන ලද්දේ 2001 වසරේදී ගෝල්ඩ්මන් සැක්ස් බැංකුකරුවෙකු වන ජිම් ඕනෙල්ය. BRICS සංවිධානය පළමු වරට රැස්වූයේ 2009 වසරේ රුසියාවේදීය. දකුණු අප්‍රිකාව එහි සාමාජිකත්වය ලබන්නේ ඉන් වසරකට පසුවයි.

BRICS රටවල් එක්ව ගත් කල වර්ග කිලෝමීටර 39,746,220ක් භූමි ප්‍රමාණයක පැතිර පවතින අතර එය ලෝකයේ සමස්ත භූමියෙන් 26.7% කි. මෙම රටවල් පහේ සමස්ත ජනගහනය බිලියන 3.21 කි. එය ලෝකයේ ජනගහනයෙන් 41.5% කි. රුසියාව, බ්‍රසීලය, චීනය හා ඉන්දියාව යන රටවල් හතර ලෝකයේ වැඩිම ජනගහනය, වැඩිම භූමි ප්‍රමාණය හා වැඩිම දළ ජාතික නිෂ්පාදිතය ඇති මුල් රටවල් 10 අතර සිටී. BRICS රටවල් පහ G20 සංවිධානයේ සාමාජිකත්වය දරන අතර මෙම රටවල් පහෙහි ඒකාබද්ධ ආර්ථික නිෂ්පාදිතය (එනම් මුළු නිෂ්පාදන ප්‍රමාණය) මිලදී ගැනීමේ හැකියාවට සාපේක්ෂව සලකා බැලූ විට G7 රටවල්වලට වඩා ඉහළ අගයක් ගනී.

## BRICS+

මේ වන විට රටවල් විස්සක් පමණ මෙම සංවිධානයේ සාමාජිකත්වය අපේක්ෂාවෙන් සිටී. සෞදි අරාබිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ඊජිප්තුව, ඇල්ජීරියාව, ආර්ජන්ටිනාව, මෙක්සිකෝව, නයිජීරියාව, බංග්ලාදේශය, ඉරානය, වෙනිසියුලාව, සිරියාව, ඉන්දුනීසියාව, ඉතියෝපියාව, බහරේන් යන රටවල් ඒ අතර වෙයි.

මෙවර BRICS සමුළුව පැවැත්වෙන්නේ එක්පසෙකින් එක්සත් ජනපදය ප්‍රමුඛ බටහිර අධිරාජ්‍යවාදී රටවල් දරුණු ආර්ථික අර්බුදයක මුහුණදී සිටින අතර වාරයකදීය. අනෙක් පසින් එක්සත් ජනපදය සිය වුවමනාවන් සඳහා චීනය හා රුසියාව යුදමය වශයෙන් වටලෑම අරමුණු කර ගනිමින් විවිධ ක්‍රියාමාර්ග තෝරමින් සිටින මොහොතකදීය. (යුක්රේන යුද්ධය, පින්ලන්තය හා ස්වීඩනයට නේටෝ සංවිධානයේ සාමාජිකත්වය ලබා දීම, තායිවාන් අර්බුදය එවැනි ක්‍රියාමාර්ග ය)

එක්සත් ජනපදය ප්‍රමුඛ බටහිර අධිරාජ්‍යවාදී රටවල් අනුගමනය කළ හා අනෙකුත් රටවලට අනුගමනය කිරීමට බල කළ නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්තිය මේ වන විට මුළුමනින්ම අසාර්ථක බව ඔප්පු වී තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස එක්සත් ජනපදය ප්‍රමුඛ බටහිර අධිරාජ්‍යවාදී රටවල් බරපතළ ආර්ථික අර්බුදයකට මුහුණ දී සිටී. ධනේශ්වර ආර්ථික විද්‍යාඥයින් පවා දැන් ප්‍රකාශ කරන්නේ නව ලිබරල්වාදයට තවදුරටත් ආර්ථිකය තුළ කාර්යභාරයක් නොමැති බවත් ඉදිරි ආර්ථික ප්‍රතිපත්තිය විය යුත්තේ බ්‍රික්ස් රටවල් තුළ අනුගමනය කරන ආර්ථික ජාතිකවාදය බවත්ය. මේ තත්වය ප්‍රායෝගිකවත් අත්දකින බොහෝ රටවල් එක්සත් ජනපදය ප්‍රමුඛ බටහිර අධිරාජ්‍යවාදී රටවල් මත තැබූ විශ්වාසය අත්හරිමින් BRICS සංවිධානය වටා එක්වෙමින් සිටී.

BRICS සංවිධානය සමඟ එක්වීමට සූදානම් රටවලට ඉඩ දෙමින් BRICS**+** ලෙස එම සංවිධානය පුළුල් කිරීම පිළිබඳව හා ඊට අවශ්‍ය ක්‍රියාමාර්ග පිළිබඳව මෙම සමුළුවේදී සාකච්ඡා කිරීමට සාමාජික රටවල් බලාපොරොත්තු වේ.

### නව ලෝක ආර්ථික රටාවක්

එක්සත් ජනපදයට සිය ලෝක ආධිපත්‍යය සාමාන්‍ය ක්‍රම මඟින් පවත්වාගෙන යාමට මේ වන විට නොහැකි වී තිබේ. ඔවුන්ට ඉතිරි වී ඇත්තේ සම්බාධක හා යුදමය ගැටුම් නිර්මාණය කිරීම වැනි රළු ක්‍රියාමාර්ගයන් පමණි. එක්සත් ජනපදයේ මෙකී ක්‍රියාමාර්ගයන්ට මුහුණදීම සඳහා, විශේෂයෙන්ම එක්සත් ජනපද ආර්ථික සම්බාධකවලට මුහුණ දීම සඳහා නව ගෝලීය ආර්ථික ක්‍රමයක් හා ඩොලරයට පරිබාහිර ජාත්‍යන්තර මුදල් ඒකකයක අවශ්‍යතාව නිර්මාණය වෙමින් තිබේ. එකී අවශ්‍යතාව BRICS සංවිධානය මගින් සම්පූර්ණ කිරීම පිළිබඳව හා ඒ අනුව BRICS මුදල් ඒකකයක් ගොඩනැගීම පිළිබඳවද මෙවර සමුළුවේදී සාකච්ඡා කිරීමට නියමිතය.

### දේශපාලනික හා ආරක්ෂක සංවිධානයක් දක්වා

BRICS සංවිධානය මෙතෙක් පැවැතියේ ආර්ථික සංවිධානයක් ලෙසටය. එහෙත් ආර්ථිකමය සංවිධානයක් ලෙස එයට යා හැකි දුර දැන් පැමිණ අවසන් කර තිබේ. මින් ඉදිරියට බ්‍රික්ස් සංවිධානය ව්‍යාප්ත වීමට නම් එයට ඉන් ඔබ්බට ගොස් දේශපාලන හා ආරක්ෂක සහයෝගිතාවද තම න්‍යාය පත්‍රයට ඇතුළත් කර ගැනීමට බල කෙරෙන තත්වයක් වර්ධනය වී තිබේ. මේ නිසා මෙවර සමුළුවේ විශේෂයක් වන්නේ BRICS රටවල් අතර දේශපාලන හා ආරක්ෂක සහයෝගිතාව ගොඩනැගීම පිළිබඳවද සාකච්ඡා කිරීමට නියමිත වීමය. ඊට සූදානම් වීමක් වශයෙන් පසුගිය ජූලි 24 - 25 අතර කාලයේදී BRICS රටවල ආරක්ෂක උපදේශකවරු දකුණු අප්‍රිකාවේදී හමුවූහ. සාම්ප්‍රදායික හා සාම්ප්‍රදායික නොවන ආරක්ෂක අභියෝගයන්, යුක්රේන අර්බුදය, ත්‍රස්තවාදයට මුහුණ දීම හා සයිබර් ආරක්ෂාව යන කරුණු එහිදී සාකච්ඡා කිරීමට නියමිතව තිබුණි.

## කියුබාව: එ.ජ. යුද සබ්මැරීනයකට විරෝධය පා




කියුබාවේ ගුවන්තනාමෝහි පවත්වාගෙන යන එක්සත් ජනපද නාවික හමුදා කඳවුර තුළ ජූලි 05-08 කාලය අතර කාලයේදී න්‍යෂ්ටික යුද සබ්මැරීනයක් නවතා තිබී ඇත. කියුබානු විදේශ කටයුතු අමාත්‍යංශය ඊට විරෝධය පළ කරමින් ජූලි එකොළොස් වන දින විශේෂ ප්‍රකාශයක් නිකුත් කරන ලදී.

"ලෝකයේ සාමකාමී කලාපයක් වන මෙම ප්‍රදේශයේ, මේ මොහොතේ න්‍යෂ්ටික යුද සබ්මැරීනයක් නවතා තැබීම පිටුපස ඇති යුදමය හේතු කුමක්දැයි ප්‍රශ්නයක් පැනනගී. ඉන් අරමුණු කරන්නේ කුමන ඉලක්කයද, එහි උපායමාර්ගික අරමුණ කුමක්දැයි" ඉන් ප්‍රශ්න කර තිබේ.

ඊට ප්‍රතිචාර දක්වමින් එක්සත් ජනපදය පවසා ඇත්තේ තමන්ගේ යුදමය උපකරණවල චලනය පිළිබඳ වෙනත් අය සමඟ සාකච්ඡා නොකරන බවත් න්‍යෂ්ටික සබ්මැරීනය ගුවන්තනාමෝ නාවුක කඳවුරට පැමිණියේ හුදෙක් සැපයුම් අවශ්‍යතා සඳහා පමණක් බවත්ය. කියුබානු ප්‍රකාශය මගින් තවදුරටත් පවසා සිටින්නේ එක්සත් ජනපදය කියුබානු භූමියේ වර්ග කිලෝමීටර් 117 ක් අවුරුදු එකසිය විස්සක් තිස්සේ ජනතාවගේ කැමැත්තට පටහැණිව අත්පත් කරගෙන ඇති බවය.

## එක්සත් ජනපදය: අවි ගත් සමාජයක ප්‍රතිඵල විඳිමින්




ජූලි 23 දිනයෙන් අවසන් වූ සතිය තුළ එක්සත් ජනපදයෙහි ප්‍රසිද්ධ ස්ථානවල වෙඩි තැබීම් නමයක් සිදුවී ඇති අතර එකී වෙඩි තැබීම්වලින් හතර දෙනෙකු මියගොස් තිස් පස් දෙනකු තුවාල ලබා තිබේ. මාධ්‍ය වාර්තා කරන්නේ 2023 වසර තුළ පමණක් එක්සත් ජනපදය තුළ මෙවැනි වෙඩිතැබීම 404 සිදුවී තිබෙන බවය. ඉන් හාරසිය පනස් තුන් දෙනෙකු මියගොස් තිබේ. එය පසුගිය වසර හා සසඳන කළ 9%ක වැඩි වීමකි. 2022 වසරේ ජූලි 23 වන විට ප්‍රසිද්ධ මහජන වෙඩි තැබීම් 363 සිදුව තිබූ අතර 2022 වසර අවසන් වන විට වසර තුළ දී මුළු ගණන 648 ක් ලෙස වාර්තා වී තිබුණි.

## තුර්කිය: ස්වීඩනයේ නේටෝ ප්‍රවේශයට එකඟ වී




ස්වීඩනය නේටෝ සංවිධානයේ සාමාජිකයකු ලෙස පිළිගැනීමට තමන්ගේ තිබූ විරෝධය ජූලි 10 වන දින තුර්කිය ඉවත් කර ගත්තාය. යුක්රේන යුද්ධය ආරම්භ වීමත් සමග, 2002 මැයි මාසයේදී, ෆින්ලන්තය හා ස්වීඩනය ඔවුන් සාම්ප්‍රදායිකව පවත්වාගෙන ගිය 'මධ්‍යස්ථ ප්‍රතිපත්තිය' අත්හරිමින් නේටෝ සංවිධානයේ සාමාජිකත්වය සඳහා ඉල්ලුම් කළහ. 2003 අප්‍රේල් මාසයේදී පින්ලන්තයට නේටෝ සංවිධානයේ පූර්ණ සාමාජිකත්වය හිමි වූ අතර තුර්කියේ විරෝධතාව නිසා ස්වීඩනයට එම අවස්ථාව නොලැබී ගියේය.

මාධ්‍ය වාර්තා කර තිබුණේ තුර්කියට යුරෝපා සංගමයේ සාමාජිකත්වය ලබාදීමට සහයෝගය දැක්වීමට ස්වීඩනය එකඟ වී ඇති අතර එක්සත් ජනපදය එෆ්-16 යුධ ගුවන් යානා තුර්කියට ලබාදීමට එකඟවීමෙන් පසුව මෙලෙස තමන්ගේ විරෝධය ඉවත් කරගෙන ඇති බවය.

## දකුණු කොරියාව: සෞඛ්‍ය සේවකයෝ අරගල මඟට



සාධාරණ වැටුපක් හා ප්‍රමාණවත් කාර්ය මණ්ඩල ලබා දෙන ලෙස ඉල්ලමින් දකුණු කොරියානු සෞඛ්‍ය සේවකයෝ ජූලි 13-14 දෙදින පුරා වැඩවර්ජනයක යෙදුනහ. කොරියාවේ සෞඛ්‍ය සහ වෛද්‍ය සේවක වෘත්තීය සමිතිය විසින් මෙහෙයවන ලද මෙම වැඩවර්ජනයට ආයතන 104ක සෞඛ්‍ය සේවකයෝ හැටදාහක් පමණ සහභාගි වී සිටියහ.

එය 2004 වසරෙන් පසු කොරියාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඇති වූ දැවැන්තම වැඩවර්ජනයයි. ඔවුන්ගේ ඉල්ලීම් වූයේ රෝගීන්ගේ ආරක්ෂාව උදෙසා හෙදියන් හා රෝගීන් අතර අනුපාතය 1:5 දක්වා ගෙන ඒම, වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව ඉහළ දැමීම සහ සාධාරණ වැටුපක් ලබා දීමය.

# වසර මැද වාර්තාව සහ ඉදිරි වසර ආර්ථිකය

මුදල් අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කරන වසර මැද මූල්‍ය වාර්තාව පසුගිය ජුනි 30 වැනිදා ප්‍රකාශයට පත් කරන ලදී. එම වාර්තාවේ ඇති පසුගිය ජනවාරි සිට අප්‍රේල් දක්වා ආර්ථිකයේ මූල්‍ය කටයුතු පිළිබඳව දත්ත සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය ලබාදීමට ඉදිරිපත් කළ වාර්තාවේ ආර්ථික දත්ත සැසඳීමක් මගින් ඉදිරි මාස කිහිපය තුළ ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ දිශානතිය පිළිබඳ දළ චිත්‍රයකින් පැහැදිලි කරගත හැකිය.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ලබාගන්නා ණය මගින් ආර්ථිකයේ ඇතිවී තිබෙන සියලු රෝගාබාධ නිවාරණය කර, නිට්ටාවටම සුවපත් කරන බවට රනිල් වික්‍රමසිංහ ජනාධිපතිගේ සිට බොහෝ ආණ්ඩුවේ ආර්ථික ඔස්තාර්ලා පසුගිය කාලය පුරාවටම ප්‍රකාශ නිකුත් කළෝය. නමුත් අප විසින් වරින් වර පැහැදිලි කළ අර්බුදයේම ඉදිරියට රට ගමන් කරනු විනා, අර්බුදයෙන් දශමයක්වත් ගැලවීමක් නොමැති බව ආණ්ඩුවේ මුදල් අමාත්‍යාංශයේම වසර මැද මූල්‍ය තත්වය පිළිබඳ වාර්තාව මගින් සනාථ කරනු ලැබ ඇත.

## ප්‍රතිව්‍යුහගත ඉලක්ක

මූල්‍ය අරමුදල පෙන්වා දෙන පරිදි ආණ්ඩුවට අර්බුදයෙන් ගොඩයාමක් ගැන සිතන්නට නම්, මූලික ඉලක්ක 3ක් ඉදිරි වසර 04 තුළ සපුරා ගත යුතුය. එනම්,

(1) දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස රජයේ ණය බර 2023 සිට 2032 වන විට 128% සිට 95% දක්වා අඩුකර ගැනීම

(2) රජයේ දළ මූල්‍ය අවශ්‍යතාවය 34.6% සිට 2027 වන විට 13% දක්වා පහළට ගෙන ඒම

(3) විදේශීය ණය ගෙවීම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 9.4%ක (2022)සිට 4.5% (2027) දක්වා අඩුකර ගැනීම


මෙම ඉලක්ක එකක් හෝ කිහිපයක් හෝ අදාළ කාලය තුළ සපුරා ගැනීමට නොහැකි වුවහොත් අර්බුදය පුපුරා ගොස් යළි දෙවන ණය ප්‍රතිව්‍යුකරණයකට යාම වැළැක්විය නොහැකිය. එසේ වුවහොත්, පළමු අවස්ථාවේදී සිදුකළ ආකාරයේ අර්බුදය කල්දමා ගැනීමේ ගොඩ වෙදකමක් ප්‍රමාණවත් නොවෙනු ඇත.

## ග්‍රෙනඩාවේ අත්දැකීම

එවැනි දෙවැනි ණය ප්‍රතිව්‍යුකරණයක් ලංකාවට සිදුකිරීමට වුවහොත් එය ග්‍රෙනඩා රාජ්‍යයට 2013 - 2015 වසරවල සිදුවූ තත්වයට බොහෝ සමාන අත්දැකීමක් වනු ඇත. 2004 - 2006 කාලයේදී ග්‍රෙනඩාව ණය ප්‍රතිව්‍යුහකරණයකට ගියද (Pre - emptive default) එය ප්‍රමාණවත් නොවීය. එම පළමු වටයේදී ඔවුන් ලංකාවේ ලෙසින්ම සෘජු ණය කපා හැරීමකට නොගිය අතර ණය ගෙවීමේ කාලය දිගු කළ අතර අමතරව කූපන් ගාස්තුව (coupon clipping) අඩු කළේය. ණය තිරසාර කිරීමට එය ප්‍රමාණවත් නොවූ තැන දෙවන ප්‍රතිව්‍යුහගත කිරීමේදී 50%කට ආසන්නව රජය ලබාගෙන තිබෙන ණය කපා හැරීමේ අමිහිරි තීරණය ගැනීමට ඔවුන්ට සිදුවිය.

2023 පළමු කාර්තුවේ ලංකාවේ මූල්‍ය කාර්ය සාධනය පිරික්සීමේදීද දැකිය හැක්කේ බොහෝදුරට මීට සමාන තත්වයකි.

එම වාර්තාවට අනුව 2023 පළමු වාස 04 (ජනවාරි - අප්‍රේල්) ආණ්ඩුවේ අයවැය හිඟය රුපියල් බිලියන 824.2කි. එය 2022 එම කාලයට වඩා රුපියල් බිලියන 300කින් වැඩිවීමකි. (2022 පළමු කාර්තුවේ එම අගය බිලියන 524.1කි.)




## ආදායම් අර්බුදය

2023 පාර්ලිමේන්තුව ඉදිරිපත් කළ අයවැය ලේඛනයේ දක්වා ඇති පරිදි 2023 අපේක්ෂිත ආදායම රුපියල් බිලියන 3408ක් වන අතර අපේක්ෂිත ආදායම් හිඟය රුපියල් බිලියන 2404කි. පළමු මාස 04 අයවැය හිඟය පමණක් බිලියන 824ක් නම් වසර අවසාන වන විට එම මට්ටම 10% - 15% පමණ ප්‍රමාණයකින් වැඩිවේ යැයි සිතිය හැකිය. එම ඉහළ යාම නොසලකා මෙමම තත්වයම පවතින්නේ යැයි සිතුවද අයවැය හිඟය අපේක්ෂිත ප්‍රමාණයට වඩා රුපියල් බිලියන 1000කින් (රුපියල් කෝටි ලක්ෂයකින්) පමණ ඉහළ යාම වැළැක්විය නොහැකිය.

රජයේ පළමු මාස 04 ආදායම රුපියල් බිලියන 820ක් වන විට අදාළ කාලය සඳහා රජයේ ණය පොලී ගෙවීම පමණක් (වාරික හැර) රුපියල් බිලියන 818.9කි. එය 2022දී මෙම කාලය තුළ රුපියල් බිලියන 426.7ක් විය. රජයේ මාස 04ක ආදායම ප්‍රමාණවත් වී ඇත්තේ යාන්තමින් ණය පොලී ගෙවා ගැනීමට පමණි. රජයේ අනෙකුත් කටයුතු කරගෙන යාම සඳහා පළමු මාස 04 තුළදී පමණක් රුපියල් බිලියන 6045.9ක් ණය ගෙන ඇත. 2022 දී අදාළ කාල සීමාව තුළදී (මාස 04ට) ණය ලබාගෙන ඇත්තේ රුපියල් බිලියන 3564.5ක් පමණි. 2023 ණය ලබාගැනීම 2022 එම කාල සීමාවට වඩා 41%ක වැඩිවිමකි.

ආණ්ඩුවේ ඇමතිවරු හා රනිල් මහදැනමුත්තා කුමක් කීවද ආණ්ඩුවේම මුදල් අමාත්‍යාංශ වාර්තා පෙන්වා දෙන සත්‍ය යථාර්ථය මෙයයි. 2023 සැප්තැම්බර් වන විට විදේශීය ණය ප්‍රතිව්‍යුහකරණයක් අපේක්ෂා කරන බැවින් පැමිණිය හැකි අර්බුද තව බොහොමයකි.

## බදු ඉහළ දැමීම

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ජුලි 12වැනිදා නිකුත් කළ නිවේදනයට අනුව 2023 පළමු මාස 06 බදු ආදායම 2022ට සාපේක්ෂව 92.5ක ඉහළ යාමකි. ඒ ගැන අප පුදුම විය යුතු නොවේ. 2023දී බදු අනුපාත ඉහළ දැමීමත්, නව බදු හඳුන්වාදීමත් වෘත්තිකයින්ටද අදාළ කරන පරිදි බදු පරාසයන් පුළුල් කිරීමෙත් ප්‍රතිඵල ලෙස මෙසේ බදු ආදායම ඉහළ යාම සිදුවිය. නමුත් ප්‍රශ්නය වන්නේ, එම ඉහළ යාම අපේක්ෂිත බදු ඇස්තමේන්තු සමග කොතරම් ප්‍රමාණවත්ද යන්නය. ආණ්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල යෝජනා කරන ඉලක්ක සපුරා ගැනීමට එම බදු ඉහළ දැමීම ප්‍රමාණවත්ද යන්නය.

## වැට් ආදායම හා අර්බුදය හෙළිදරව්ව

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අනුව පළමු මාස 06 වැට් බදු ආදායම රුපියල් බිලියන 230.6කි. ආණ්ඩුවේ අයවැය අපේක්ෂාව අනුව වසර තුළ වැට් බදු ආදායම රුපියල් බිලියන 912කි. මූල්‍ය අරමුදල පුරෝකථනය කර ඇති එම අගය රුපියල් බිලියන 796කි. 912 පැත්තක තබා 796 පමණක් අදාළ කළද, එම වැට් බදු ආදායම ඉලක්කය සැපිරීමට නම්, ඉදිරි මාස හයේදී තවත් රුපියල් බිලියන 566ක් ආණ්ඩුව එකතු කර ගත යුතුය. එය දැනට පළමු මාස 06 එකතු කර ඇති ප්‍රමාණය මෙන් දෙගුණයක්ද ඉක්මවන ඉලක්කයකි. මෙම 230 ඉලක්කය ළඟාකර ගෙන ඇත්තේද 08% පැවැති වැට් බදු අනුපාතය 15%ට වැඩි කරගෙනය. තවත් දෙගුණයක් වැට් බදු වැඩිකර ගැනීමට නම් ආණ්ඩුව අනිවාර්ය ලෙසම තවත් වැට් බදු ආදායම් ඉහළ දැමිය යුතුමය.

## සමාගම් සහ සමාගම් නොවෙන බදු

එසේම සමාගම් හා සමාගම් නොවන බදු (cooperate and non cooperate) ආදායම පළමු මාස 06 තුළ රුපියල් බිලියන 243.8ක එකතු කර ඇත.

එසේම පුද්ගලික ආදායම බදු ලෙස තවත් බිලියන 70ක් එකතු කරගෙන තිබේ. (මුළු එකතුව රුපියල් බිලියන 313.18කි.) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල 2023ට ලබාදී ඇති පුරෝකථන ඉලක්කය රුපියල් බිලියන 895කි. ලබා ඇති ආදායම සහ රජයේ ආදායම සැසඳීමේදී ඉදිරි මාස 06 තුළ තවත් රුපියල් බිලියන 582ක් (රුපියල් කෝටි 58,200ක) සමාගම් හා ව්‍යාපාර, පුද්ගල බදුවලින් උපයා ගන්නේ නම්, ඉතිරි කර්මාන්ත, සමාගම් ව්‍යාපාර හා පුද්ගලික ආදයම් උපයන්නන්ට අබ සරණය. දැනටත් වඩා ඉදිරියේදී ව්‍යාපාරිකයන් හා වෘත්තිකයන් රට හැර යාමත් ව්‍යාපාර වසා දැමීමත් දැක ගැනීමට හැකිවනු ඇත.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඉලක්ක හා 2022 ලැබූ ආදායමට වඩා 2023 පහළ ගිය එකම ආදායම සූදු හා ඔට්ටු බදු එකතු කිරීමය. 2023 පළමු මාස හයේ සූදු හා ඔට්ටු බදු ආදායම 2022ට වඩා රුපියල් බිලියන 468කින් (රුපියල් කෝටි 46800 කින්) පහළ ගොස් ඇත. ඒ ලංකාවෙ අනෙකුත් කර්මාන්ත ව්‍යාපාර මෙන් සූදු හා ඔට්ටු ව්‍යාපාර, කැසිනෝ, රේස් බයි රේස් ආයතන වසා දැමීම නිසා නොව ඔවුන් ආණ්ඩුවේ චෞර වළල්ලේ ගජ මිතුරන් බැවිනි.

මීට අමතරව රේගු හා සුරා බදු දෙපාර්තමේන්තුවේ ආදායම ඉලක්කද සපුරා ගැනීමට ආණ්ඩුව අසමත් වී ඇත. ඒ මතපැන් බීම ජනතාව නතර කිරීමේ ප්‍රතිඵල නිසා නොව බදු ගෙවීම පැහැර හැරීම හා අල්ලස් දූෂණ නිසා එසේ ගෙවීම පැහැර හැරීමට ඉඩදී තිබීම නිසාය. සුරාබදු දෙපාර්තමේන්තුව පළමු මාස 06 තුළ රුපියල් බිලියන 58ක් බදු ආදායමක් උපයා ඇති අතර එය අපේක්ෂිත 2023 ආදායමෙන් 11%ක් පමණි.

මුදල් අමාත්‍යාංශයේ මධ්‍යකාලීන වාර්තාවේ 2.3 වගුවේ (පිටුව 15) දක්වා ඇති පරිදි මේ සියලුම ක්ෂේත්‍රවල බදු ආදායම ලෙස (දේශීය ආදායම, රේගුව, සුරාබදු) ලෙස දක්වා ඇති සත්‍ය ආදායම රුපියල් බිලියන 743කි (රුපියල් කෝටි 74,300කි). නමුත් 2023 වසර සඳහා ආණ්ඩුවේ අපේක්ෂිත බදු ආදායම රුපියල් බිලියන 3130කි. ඉතිරි මාස 06 තුළ මෙම ඉලක්ක සැපිරීමට නම් ආණ්ඩුව විශ්මකර්ම බදු ඒකරාශී කිරීමක් කළ යුතුමය. එසේ නැතිනම්, අප මෙම සාකච්ඡාවේ මුලින්ම සඳහන් කළ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ණය තිරසාරකරණය සඳහා ලබාදී ඇති ඉලක්ක ත්‍රිත්වය සැපිරිය නොහැකිය. එම ඉලක්ක සැපිරීමට තවදුරටත් මූල්‍ය අරමුදල මෙම වැඩසටහනේ සිටීම ගැටලු සහගතය. ආණ්ඩුව පත්වී ඇත්තේ 'ගෙදර ගියොත් අඹු නසී, මඟ සිටියොත් තෝ නසී' යැයි පැරණි ගැමි වහරේ උපහැරණයද වෙනස් කර, "ගෙදර ගියත් මඟ සිටියත් තෝ නසී" තත්වයකය.

කොතරම් මතුපිට සෝභන, නාටක, දර්ශන මගින් වසං කිරීමට උත්සාහ කළත්, ආණ්ඩුවේ විශ්ලේෂණ වාර්තා පෙන්වා දෙන්නේ, ධනපති පාලකයන් විසින්ම විනාශ මුඛයට ගෙන ගිය මේ ගරා වැටෙන සිස්ටම් එක තවත් තාවකාලික පැලැස්තරවලින් වැසිය නොහැකි බවය. ආණ්ඩුවේ මධ්‍ය වාර්ෂික මුදල් වාර්තාව ඔප්පු කරන්නේද අප සමාජය සමග සිදුකරන සංවාදයේ නිවැරදි බවයි. ප්‍රමාද නොවී සමාජ පරිවර්තනයකට අවශ්‍යම මූලික අඩිතාලම සමාජයේම බහුතරයේ කැමැත්තෙන් නිර්මාණය කළ යුතුමය.

**2023 ජනවාරි සිට අප්‍රේල් දක්වා අයවැය සාරාංශය**

(මිලියනවලිනි)

| | 2022 | 2023 |
|---|---|---|
| ආදායම් සහ දීමනා | 631,129 | 821,346 |
| ආදායම් | 630,908 | 820,070 |
| බදු ආදායම් | 543,649 | 742,578 |
| බදු නොවන ආදායම් | 87.259 | 77,493 |
| දීමනා | 221 | 1,276 |
| වියදම | 1,155,229 | 1,645,602 |
| පුනරාවර්තන | 1,016,810 | 1,484,984 |
| පොලී ගෙවීම | 426,786 | 818,969 |
| වෙනත් | 590,023 | 666,015 |
| රාජ්‍ය ආයෝජන | 140,999 | 177,903 |
| වෙනත් | (2,580) | (17,285) |
| ජංගම ගිණුමේ අතිරික්තය (+)/හිඟය (-) | (385,902) | (664,913) |
| සමස්ත අයවැය අතිරික්තය (+)/හිඟය (-) | (524,100) | (824,256) |
| මූල්‍යකරණය | 524,100 | 824,256 |
| විදේශ මූල්‍ය | (126,985) | (77,498) |
| ණයට ගැනීම් | 111,742 | 49,970 |
| ආපසු ගෙවීම් | (238,727) | (127,468) |
| දේශීය මූල්‍යකරණය | 651,085 | 901,753 |
| ණය ගැනීම් | 3,564,527 | 6,045,994 |
| ආපසු ගෙවීම් | (2,913,443) | (5,144,241) |



"සමාජයේ වෙනස්වීම සිදුවන්නේ එහි පවතින ප්‍රතිවිරෝධයන්ගේ වර්ධනය හේතුවෙනි. නිශ්පාදන බලවේග සහ නිශ්පාදන සම්බන්ධතා අතර ප්‍රතිවි-රෝධයේත්, පංති අතර ප්‍රතිවිරෝධයේත්, අභාවයට යන පරණ දේ හා නැගී එන අලුත් දේ අතර ප්‍රතිවිරෝ-"ධයේත් වර්ධනය හේතුවෙනි. පැරණි සමාජය යට කරගෙන අලුත් සමාජයට ඉදිරියට වර්ධනය වීමට ඉඩ දෙන්නේත් මේ ප්‍රතිවිරෝධය නිසාය."

**මාවෝ සේතුං**
**තෝරා ගත් කෘති, 1කාණ්ඩය, 314 පිටුව**



# "තැලෙන යකඩ" වීමට බල කෙරුණු කල

නින්දා අපහාස යනු ගැහැනුන්ට නුහුරු නුපුරුදු දෙයක් නොවේ. අතීතයේ ගැහැනුන් පෙළූ බමුණු මත හා සමානවම පසුගාමී ආසියාතික සමාජයේ ගැහැනියට නින්දා අපහාස හා විවිධාකාර වූ තාඩන පීඩනයන්ට ගොදුරුවන්නට සිදුව තිබේ. මවක්, බිරිඳක්, සොහොයුරියක්, දියණියක් යන මේ කවර භූමිකාවක් දැරුවද මේ සමාජය ගැහැනිය දෙස බලන්නේ වපරැසිනි.

අංශු මාත්‍රවූ වරදකට පවා දෝෂාරෝපණයට ලක්වන ඇය තීව්‍ර වන ආර්ථික අර්බුදය විසින් ජනිත කරන සමාජීය ගැටලුවලටද වගකිව යුත්තා බවට පත්ව සිටියි.

"අන්න ස්පා කෑල්ලක්" යැයි පාර අයිනේ හොඳින් හැඳ පැළඳගෙන මේකප් දමා සිටි යුවතියක් පසුකර, යතුරු පැදියක යන මැදිවියේ පිරිමියෙක්, පසුපස අසුනේ වාඩිවී ගමන් කරනා බිරිඳ යැයි සිතිය හැකි කාන්තාවකට පැවසූ විට ඇය අපුලෙන් ඉවත බලාගත් අයුරු

මගේ නෙත ගැටිණි. මා බසයක් එනතුරු රැඳී සිටි විනාඩි දහයක පමණ කාලය තුළ එකී තරුණිය පසුකර ගිය බොහෝ පිරිමින් ඇය දෙස බැලුවේත්, විසිල් ගැසුවේත්, කුමක් හෝ අයුරකට ඇයට අවධානය යොමු කළේත් ඇය ස්පා එකක වැඩකරන කෙනෙකු හෝ වෙනත් අයුරකින් ඇඟ විකුණන යුවතියක්ය යන අදහස ඇතිව බව පෙනී ගියේය.

තමන් කරන කුමන හෝ රැකියාවෙන් උපයන ආදායම තමන්ගේ හෝ පවුලේ ජීවත්වීමට ප්‍රමාණවත් නොවූ විට කාන්තාවන්ට අමතර ආදායමක් ලබා ගැනීමට බලකෙරෙයි. දරුවන්ගේ අධ්‍යාපන වියදම් දැරිය නොහැකි වූ විට, දරුවන්ට නිසි ආහාර වේලක් දෙන්නට නොහැකි වූ විට අම්මලා නොකරන්නේ කුමක්ද? වගා පාළු වී ගොවිතැන් කටයුතුවලට ලබා ගත් ණය ගෙවා ගැනීමට නොහැකි වූ දෙමව්පියන්ගේ දරුවන්ද, ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබාගෙන ඒවා ගෙවා ගැනීමට නොහැකි වූ කාන්තාවන්ද තම ඇඟ විකුණා හෝ ආර්ථික අපහසුතා මඟහරවා ගැනීමට පෙළඹීම පුදුමයක් නොවේ. ඔවුනට එවැනි දේට යොමුවිය හැකි ලෙස විශාල වශයෙන් ස්පා නමට මුවාවී ක්‍රියාත්මක ගණිකා නිවාස හා ආගන්තුක නිවාස තිබේ.

එසේම කසිප්පු වෙළඳාම, කුඩු විකිණීම වැනි දේට කාන්තාවන් යොමුවන්නේද කුසගින්න නිසා මිස වෙනකක් නිසා නොවේ. තම දරුපැටවු කුසගින්නේ හඬන විට සමාජ සාරධර්මවලට පයින් ගසන්නට මවකට සිදුවීම තුළ පුදුම විය යුත්තක් තිබේද? එහෙත් කසිප්පු විකුණන කාන්තාවක් දෙස සමාජය බලන ආකාරයත් එයම කරන පිරිමියෙකු දෙස බලන ආකාරයත් දෙයාකාරයක් ගනී.

පසුගිය දිනෙක බම්බලපිටිය ප්‍රදේශයේ ගණිකා නිවාසයක් පොලීසිය විසින් වටලා එහි සේවයේ යෙදී සිටි අය අත්අඩංගුවට ගත් අතර වැඩි පිරිසක් කාර්යාලවල සේවය කරන්නියන් බව සඳහන් වී තිබුණි. මේ සිදුවීමෙන්ද පැහැදිලි වන්නේ රජයේ හෝ පෞද්ගලික ආයතනයක රැකියාවල නියුතු කාන්තාවකට වුවද ජීවත්වීම උදෙසා වැටුප ප්‍රමාණවත් නොවෙන බව නොවේද? නමුත් පොදු සමාජය මෙම සිදුවීම් දෙස බැලීමට හුරු වී ඇත්තේ එම කාන්තාවන් මත වරද පටවමිනි.

පසුගිය දිනක එක්තරා විහාරස්ථානයක ඇති වූ සිදුවීමේදී වධාත්ම පහරකෑමට ලක් වූයේ එම ස්ථානයේ සිටි කාන්තාවන්ය. එමෙන්ම එම පහර දුන් පිරිස පරුෂ වචනයෙන් බැණ වදිමින් වැඩිම චෝදනා එල්ල කළේත් එම කාන්තාවන්ටම බව සමාජමාධ්‍යයන්හි හුවමාරු වූ වීඩියෝවල දැක ගන්නට තිබිණි.

පාරක් අසල විනාඩි දහයක් හිටගෙන සිටින්නට සිදුවන කාන්තාවකටත්, කොළ කැඳ කෝප්පයක් විකුණා හෝ පිළිවෙළකට ඇඳ පැළඳ සිටින කාන්තාවකටත්, ශරීරයේ ටැටූ එකක් ගැසූ තරුණියකටත්, හිස කෙස් වර්ණ කළ තරුණියකටත්, කෙස් වැටිය පිළිකා රෝහලට පරිත්‍යාග කරන්නට කොණ්ඩය කොටට කැපූ කාන්තාවකටත්, මේ සමාජයේ ඇති පදම් අපහාසවලට ගොදුරුවන්නට සිදුව ඇත්තේය.

තවමත් සමාජය ඇඟිල්ල දිගු කරන්නේ මේ දහසකුත් එකක් පීඩාවන් දරා සිටිනා ගැහැනුන්ටම මිස ඒ පීඩාව ගැහැනුන් මත පැටවූ මේ දුෂ්ට සමාජ ක්‍රමයට හෝ ඒ ක්‍රමය නඩත්තු කරමින් වැජඹෙන පාලකයන්ට නොවේ. එය තවත් ඛේදවාචකයකි.

ගැහැනුන් වැඩි වශයෙන් පෙළන මේ නරුම, දුෂ්ට සමාජ ආර්ථික ක්‍රමය මුලිනුපුටා දැමීම වෙනුවෙන් නිවස තුළ මෙන්ම මහමඟද, වැඩබිමේද, බස් රියේද පීඩාවට පත්වන ගැහැනුන් එක පෙළට සිට ගත යුතු නොවේද?

## තබන තබන පියවර දිගු නෑ හෙටට...

කෙතක් ලෙසින් ගෙයි බත් පත සරි කෙරුව
සිතක් ඇතිව දුක දැක හද ගිනි දැරුව
වතක් ඇතිව ඒ දුක සඟවා හැඬුව
කතක් මිසක කවුරුද ගැරහුම් දැරුව

කන්දක් තරම් ලද අවමන් දරන්නේ
කෙන්දක් පමණි ගරු බුහුමන් ලැබෙන්නේ
නින්දක් වුවත් නෑ සැනසුම විඳින්නේ
හැන්දක් ඇතත් ඉන් කොටසකි බෙදෙන්නේ

දරා හීන අහසට ඉණිමං තැනුවා
වරා සතුට ඒ හීනෙට පෙම් පිරුවා
ඉරා සිතැගි සී සීකඩ විසි කෙරුවා
සරා සඳට රෑ මැදියම ගිනි වැදුනා

කැපූ ඉන්න සැඩ වතුරක ගියේ නම්
නෙළූ පළා සා ගින්නට නොවේ නම්
වැටත් නියර හා අස්වනු බුදී නම්
දෑත් කුමට එක මිටකට නොවේ නම්

ගහන ගහන ගල් අවුලන්නට නොසිට
වැටෙන වැටෙන විට හිටගත යුතු අපට
දකින දකින රිසි හිරු පායන ලෙසට
තබන තබන පියවර දිගු නෑ හෙටට

## 'ගැහැනිය' ගැන වෙනස්ව දකින සමාජයක් ගොඩනගමු!



**ප්‍රභාෂිනී වික්‍රමසිංහ සහෝදරිය**

**විධායක සභික - අයිතීන් උදෙසා කාන්තාවෝ සංවිධානය**

කාන්තා පීඩනය කියන්නෙ අලුත්ම තත්වයක් නොවෙයි. මේ පිළිබඳ සංවාදය කාලෙන් කාලෙට උඩ යට යනවා. අපි ජීවත්වෙන සමාජය ගැහැනියට එක්තරා රාමුවකට කොටු කරලා තියන්න තමයි කැමති. මේ රාමුව හැදිල තියෙන්නෙ සමාජ ආර්ථික කොන්දේසිවල ප්‍රතිඵලයක් විදියට. එනිසා බොහෝ පිරිමි වගේම ගැහැනුත් මේ රාමුව ඇතුලේ 'ගැහැනිය' සිටිනවාට කැමතියි. මිනීමැරීමක්, ලිංගික අපචාරයක් හෝ ඕනෑම සමාජ විරෝධී ක්‍රියාවක් සඳහා පිරිමින්ට එක ආකාරයකටත් ගැහැනුන්ට තව ආකාරයකටත් තමයි සමාජය සලකන්නෙ. මෙන්න මේ කාන්තාවන් දෙස බලන ආකල්පය, දෘෂ්ටිය තමයි අපි වෙනස් කරන්න ඕනෑ. හැබැයි කන්දක් නාය යනවා වගේ කඩා හැලෙන ආර්ථිකයක් ඇතුලේ මේ තත්වය වෙනස් කරන්න බැහැ. තම දරුවන්ගේ කුසගින්න වෙනුවෙන් අම්මා කෙනෙක්ට ඕනෑම දෙයක් කරන්න පුළුවන්. ඒක සමාජ විරෝධීද, සදාචාර විරෝධීද කියන එක ඇයට අදාළ නැහැ.

ඒ නිසා වර්තමානයේ අපි පෙළමින් ඉන්න ආර්ථික පීඩනය කෙමෙන් අවසන් වෙමින් කාන්තාවන්ට සම සමව මේ ආර්ථිකයට දායක වෙන්න සහ ප්‍රතිලාභ ලබන්න අයිතිය අවශ්‍යයි. එවැනි සමාජයක් ගොඩ නැගෙනවට සාපේක්ෂව තමයි කාන්තාවන් දෙස සමාජය මේ බලන ආකාරයත්, ආකල්පත් වෙනස් වෙන්නෙ. ඉතින් කාන්තාවො විදියට මේ ජරාජීර්ණ සමාජ ක්‍රමය වෙනස් කර ගැනීම අපේ යුතුකමක්.

ලොව දෙසින්

## මනිපූර් හි විරෝධතා

ඉන්දියාවේ මනිපූර් ප්‍රදේශයේ පසුගිය මැයි 3 වනදා සිට විරෝධතා කැරලි ඇතිව තිබේ. විශේෂයෙන් මෙම ගැටුම් මෙයිටි සහ කුකි ගෝත්‍රික කණ්ඩායම් අතර ඇතිව තිබේ. එසේ තිබියදී යම්කිසි කල්ලියක් විසින් කුකි ගෝත්‍රික කාන්තාවන් දෙදෙනෙකු නිරුවතින් අඩන්තේට්ටම් කරමින් ඇදගෙන ගොස් දූෂණය කොට මරා දැමීමෙන් විරෝධතා වර්ධනය වෙමින් පවතී. මානව හිමිකම් ක්‍රියාකාරීන් සහ මෙම විරෝධතාකරුවන් දැඩිලෙස ඉල්ලා සිටින්නේ මෙම සිදුවීම සම්බන්ධයෙන් විධිමත් සහ අපක්ෂපාතී විමර්ශනයක් සිදුකරන ලෙසයි. මේ සම්බන්ධ වීඩියෝවක් ට්විටර් මගින් සංචරණය වීම මත ආණ්ඩුව සමාජ මාධ්‍ය ජාලයට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන ඇතත් මෙම පුද්ගලයින් සම්බන්ධයෙන් මේ දක්වා සැළකිය යුතු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. මෙම විරෝධතා සඳහා විශේෂයෙන් ගෝත්‍රික කාන්තාවන් සම්බන්ධ වී සිටී. අපරාධකරුවන්ට දඬුවම් ලබාදීමත් මනිපුරි ප්‍රදේශයේ පවතින ජාතිකත්ව ගැටුමට විසඳුම් ලබාදෙන ලෙසට බල කිරීමත් විරෝධතාකරුවන්ගේ ප්‍රධාන අරමුණයි.

## ප්‍රතිපත්ති ප්‍රකාශයෙන් ඉවතට

ස්ත්‍රී පුරුෂ සමාජ භාවය මත යුක්තිය සහ සමානාත්මතාවය ලබා දීම මේ වන විටත් සම්පූර්ණ කර ඇති බැවින් දැනටමත් සම්පූර්ණ කරන ලද කාර්යයක් ප්‍රතිපත්තියක් වශයෙන් නැවත තබාගැනීමේ අවශ්‍යතාවයක් නොමැති බව ඉරානය ප්‍රකාශ කරයි. මෙය, එරට නව සංවර්ධන සැලැස්ම තුළ ස්ත්‍රී පුරුෂ සමාජ භාවය මත යුක්තිය සහ සමානාත්මතාවය පිළිබඳව සඳහන් නොකිරීම සාධාරණීකරණය කිරීමකි. මෙය එරට කාන්තා අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින පිරිස අතර කැළඹීමක් ඇති කිරීමට හේතුවී තිබේ. ඉරානයේ සංවර්ධන සැලැස්ම මේ වන විට එහි හත්වන සංස්කරණය දක්වා පැමිණ තිබේ. මෙහි පෙර සංස්කරණ වල කාන්තාවන් සවිබල ගැන්වීම සම්බන්ධයෙන් සඳහන් කර තිබුණි. ඉරනයේ මාස්හා අමීනි තරුණිය මියයාමත් සමග ඇතිවූ අරගලය හේතුවෙන් ඉරානයේ කාන්තා අයිතිවාසිකම් පිළිබඳව ලෝකයේම අවධානය යොමුව ඇති අවස්ථාවකදී මෙවැනි අත්තනෝමතික තීරණයක් ගැනීම තුළ කාන්තාව සම්බන්ධයෙන් ඉරාන පාලනයේ පවතින නොසැළකිලිමත් බව මනාව පැහැදිලි වෙයි.

## පුළුල් අර්ථකතනයක්

පසුගිය ජුනි මස 27 වනදා යුරෝපීය පාර්ලිමේන්තුවේ සිවිල් අයිතිවාසිකම් සහ කාන්තා අයිතිවාසිකම් පිළිබඳ කමිටුව කාන්තාවන්ට එරෙහි හිංසන සහ ගෘහස්ථ හිංසන වලට එරෙහිව ක්‍රියාත්මක වීමේ මාර්ගෝපදේශනයක් සම්මත කරන ලදි. මෙමගින් කාන්තාවගේ කැමැත්ත නොමැතිව ලිංගිකව එකතුවීම, එයට බලකිරීම අපරාධමය වැරදි ලෙස අර්ථ දැක්වීමට යෝජනා කර තිබේ. එමෙන්ම කාන්තාවගේ කැමැත්ත සළකා බැලීමේදී ඇයට ඇත්තෙන්ම ස්වේච්ඡාවෙන් කැමැත්ත අකමැත්ත ප්‍රකාශ කිරීමට නිදහස් අවස්ථාවක්, අවකාශයක්, හැකියාවක් පැවතියේද යන්න පිළිබඳව විමසා බැලීමටද යෝජනා වී තිබේ. ඒ අනුව කාන්තාවක් අකමැත්ත ප්‍රකාශ නොකළද අකමැත්තෙන් ඇයට එම තත්ත්වයට පෙළඹීමට සිදුවන පසුබිම පුළුල් ලෙස සළකා බැලීමද ඒ අනුව අපරාධකරුවන්ට දඬුවම් පැමිණ වීමටද යෝජනා වී තිබේ.

# සහකම්පනයෙන් තොර සමාජයක්!



ලංකාවේ පසුගාමී ධනවාදය තුළ ගෙවුණු වසර 45ක් තිස්සේ පවත්වාගෙන ආ, නව ලිබරල්වාදී ආර්ථික උපායමාර්ගය විසින් විනාශ කරනු ලැබ ඇත්තේ රටේ ආර්ථිකය පමණක් නොවේ; රට තුළ ජීවත්වන ජනතාවගේ සිතුම් පැතුම් හා චින්තනයද විශාල විපර්යාසයකට බඳුන් කරනු ලැබ තිබේ.

දැන් අපේ සමාජය තුළ අපට වැඩිපුර හමුවන්නේ නිතර කෝපයෙන් පසුවන, ආත්මාර්ථකාමී, එකිනෙකා පිළිබඳ සහකම්පනය නැති යාන්ත්‍රික මිනිසුන් පිරිසකි. සියල්ලෝම නොදන්නා තරගයකට හසුවී, ගැලවීමක් නැතිව දුවති. වර්තමානය තුළ ජීවත්වීම තරගයකි. දරුවන්ට උගැන්වීමට (අධ්‍යාපනය) තරගයකි. ගමනාගමනය තරගයකි. එකිනෙකා සමග තරගයට දුවන පොදු මගී බස් රථවලත් විනයක් නැත. තරගයට දුවන අනෙකුත් වාහනවලින් මහ මඟ පිරී තිබේ. බසයක, දුම්රියක අසුනක් ලබා ගැනීම තරගයකි. මේ සියලු තරග ඇත්තේ මිනිසුන් මිනිසුන් අතරය. එවිට විනාශ වන්නේ මිනිස්කමය. තවකෙකුගේ ගැටලුවක්, දුකක්, වේදනාවක් අනෙකාට අදාළම නැත. එවැනි සමාජයක ජීවත්වීම ඉතාම දුෂ්කරය.

මෙය තනි තනි මිනිසුන්ගේ වරදක් නොවේ. මෙය නව ලිබරල්වාදී සමාජ ක්‍රමය විසින් උරුම කර දී ඇති ඛේදවාචකයකි.

## සාමූහිකත්වය බිඳ දමා

ලංකාවේ පූර්ව ධනේශ්වර සමාජ ක්‍රමය අප හඳුනා ගන්නේ ආසියාතික නිෂ්පාදන රටාවක් සහිත සමාජයක් ලෙසිනි. එය වැඩවසම් සමාජ ලක්ෂණ පෙන්නුම් කළද, ඊට සර්ව සම නොවේ. ලංකාවේ පැරණි ආසියාතික ක්‍රමය තුළ ප්‍රධාන ජීවනෝපාය වූයේ කෘෂිකර්මාන්තයයි. ආසියාතික සමාජය තුළ ප්‍රධාන ආර්ථික ක්‍රමය වූ කෘෂිකර්මාන්තය සඳහා අත්‍යවශ්‍ය සාධකය වූයේ ශ්‍රම සාමූහිකත්වයයි. සාමූහිකත්වයෙන් තොරව ගොවිතැන් කිරීම කළ නොහැකි දෙයක් විය. මේ නිසාම එකල ක්‍රීඩාව තුළද, සමාජයීය සියලු ක්‍රියාකාරකම් තුළද සාමූහිකත්වය දැකිය හැකි විය. මේ නිසාම එක් ප්‍රදේශයක ජීවත්වන ජනතාවට එකිනෙකාගේ උදව් අවශ්‍ය විය. එකිනෙකා නැතිව බැරි විය. ඒ නිසාම එකිනෙකාට පිහිට වීමේ අවශ්‍යතාවය විසින් සාමූහිකත්වය හා මිනිස් සිත් තුළ සහකම්පනය පැවැතිණි. ආසියාතික සමාජය දියුණු සමාජයක් නොවූවද එහි ආර්ථික රටාවේ අවශ්‍යතාවය විසින් නිර්මාණය වූ මානව සාමූහිකත්වය හොඳ දෙයක් විය.

## නව ලිබරල්වාදය කළ වෙනස

ලංකාව තුළ බ්‍රිතාන්‍යයන් විසින් ධනේශ්වර ක්‍රමය උත්තරාරෝපණය කිරීම නිසා ආරම්භක ධනවාදය තුළ ඊට පෙර පැවැති ආසියාතික සමාජයේ නෂ්ටාවශේෂ රැසක් ඉතිරිව තිබිණ. ඒ අතර කුල ක්‍රමය, ප්‍රභූ වන්දනාව වැනි නොගැලපෙන දේ සේම, සාමූහිකත්වය වැනි හොඳ ලක්ෂණද ඉතිරි වී පැවැතිණි. 1977 දක්වා ලංකාවේ ධනපති ආණ්ඩු විසින් පවත්වාගෙන යනු ලැබූ රාජ්‍ය ඒකාධිකාරී ධනවාදය, සාමූහිකත්වයට විශාල හානියක් නොකළ බැවින් එය සමාජය තළ වෙනස්කම් සහිතව වුවත් පැවැතිණි.

එහෙත් 1978 දී එවකට පැවැති ආණ්ඩුව විසින් නව ලිබරල් ආර්ථිකය (විවෘත ආර්ථිකය) හඳුන්වා දීමත් සමග ක්‍රමානුකූලව එතෙක් පැවැති සමාජ ව්‍යුහය වෙනස් වූ අතර නව ආර්ථික වුවමනාවට ගැලපෙන ලෙස මිනිසුන්ගේ සිතුම් පැතුම්ද වෙනස් විය. නව ලිබරල්වාදය තනි තනි ඉලක්ක කරා හඹා යන තනි හුදකලා මිනිසෙකු නිර්මාණය කළ අතර, මුදල් සෙවීම ජීවිතයේ එකම හා පරම අරමුණ බවට පත් කළේය.

නව ලිබරල්වාදය විචිත්‍ර විවිධ භාණ්ඩ පිරුණු වෙළඳපොළක් නිර්මාණය කළ අතර, එම වෙළඳපොළේ ඇති භාණ්ඩ මිලදී ගන්නා ලෙස විවිධ උපක්‍රම හා වෙළඳ දැන්වීම් මගින් ජනතාවට බලකරන ලදී. ඒ අනුව අවසානයේදී අධි පරිභෝජනවාදී මිනිසෙක් නිර්මාණය කරනු ලැබීය. පරිභෝජනය ජීවිතයේ අරමුණ බවට පත්කළ නව ලිබරල්වාදය ඒ සඳහා කෙසේ හෝ මුදල් ඉපයිය යුතු බවටද බල කළේය. 'බල්ලෝ මරා හරි සල්ලි හොයමු' වැනි ආකල්ප බිහිවූයේ ඒ තුළය. මේ සියල්ල තුළ එක් දෙයක් මිය යමින් තිබිණි. ඒ මිනිසුන් අතර පැවති මනුෂ්‍යත්වය හා සාමූහිකත්වයයි.

## සහකම්පනය නොදැනීම

දැන් තමන්ගේ ප්‍රශ්නයකදී හැර පොදු ව්‍යසනවලදී දැකිය යුතු සහකම්පනය අවශ්‍ය ප්‍රමාණයෙන් නොදැනෙන බහුතර ජනතාවක් බිහිවී සිටී. බෙහෙත් විෂ වී රෝහල්වල රෝගීන් මිය යාම දැන් සමාජයට ප්‍රවෘත්තියක් පමණි. රිය අනතුරකින් 10-15ක් මිය යාමද දින දෙකකින් අමතක වන ප්‍රවෘත්තියකි. ජනමාධ්‍යද එවැනි සිදුවීම් ප්‍රවෘත්ති බවට පත්කර ගන්නවා මිස, එහි සමාජ කම්පනයක් ඇතිවීම වැළැක්වීමට හිතාමතාම කටයුතු කරති. පන්සලක භික්ෂුවක් කාන්තාවන් ගෙන්වාගෙන සිටින විට (එය වැරදි ක්‍රියාවකි) එතැනට කඩා වැදී කාන්තාවන්ට හිරිහැර කරන, ඔවුන්ගේ වීඩියෝ පට සමාජයට මුදාහරින තත්වයට මිනිසුන් පත්ව සිටීම තුළින් පෙන්වන්නේද මේ මානව හැඟීම් බිඳවැටීමයි.

මිනිසුන් තුළ දැන් සංයමය බිඳවැටී ඇත. තර්කනය අහෝසි වී ඇත. මිනිස්සු නිතරම එකිනෙකාට එරෙහිව නොදන්නා කෝපයකින් පසුවෙති. වාහන අනතුරක් සිදුවූ විට සෙවීමක් බැලීමක් නොමැතිව රියදුරුට පහර දෙන්නේත්, වාහනය ගිනි තබන්නේත් මේ කෝපය විසිනි. එහෙත් එවැනි අය තමන් වාහනයක් පදවන විට එම පරෙස්සම තබා ගන්නේද නැත.

## වෙනසක් ඉල්ලන සමාජය

රටක්, සමාජයක් මේ මට්ටමට පිරිහීම යනු, අදාළ සමාජයට ගමන් කරන මාවතේ තවදුරටත් ඉදිරි ගමනක් නැති බව ප්‍රකාශයට පත්වීමකි.

සමාජයක බහුතරය නරුමවාදයට වැටෙන්නේ එම සමාජයේ ආර්ථික රටාවත්, දේශපාලනයත් නරුම වූ විටය. එසේ නැතිව මිනිසුන්ගේ පෞද්ගලික වරදක් නිසා නොවේ. සමාජයක නරුමභාවය පෙන්වන හොඳම කැඩපත, පාලකයින්ගේ වගවීමෙන් තොර හැසිරීමය. රෝහල් ඉදිරිපිට මල් ශාලාවක් තිබෙන්නේ රෝගීන් මියයාම ස්වභාවික නිසා යැයි මෑතකදී ප්‍රකාශ කළේ මෙරට සෞඛ්‍ය ඇමතිවරයාය. මගීන් 12කට මරු කැඳවූ මනම්පිටිය ප්‍රදේශයේ රිය අනතුරෙන් පසුත් පාලම අලුත්වැඩියා කිරීමට සල්ලි නැති බව ප්‍රකාශ කළේ අදාළ ඇමතිවරයාය. සුප්‍රසිද්ධ පඬුකරඳ ශාකය විනාශ කිරීමද තවත් නිදසුනකි.

වරක් ඔස්කා වයිල්ඩ් ප්‍රකාශ කළ පරිදි, මේ නරුම සංස්කෘතිය ගොඩනැගූවන් 'හැම දේකම මිල දන්නා එහෙත් වටිනාකම නොදන්නා' අයය.

දැන් තවදුරටත් අපේ සමාජයට මේ ආකාරයෙන් ඉදිරියට යාමට නොව, පැවතීමටද නොහැකි ඉමකට පැමිණ තිබේ. එය විසින් ඉල්ලා සිටින්නේ කුමක්ද? ඒ, පවතින සමාජ, ආර්ථික, දේශපාලන දේහයේ ගැඹුරු වෙනසකි. සමාජ පරිවර්තනයකි. මරාදමා ඇති මනුෂ්‍යත්වයට පණ දෙන නව සමාජයක් වහාම බිහිකළ යුතුය. සමාජය පිළිබඳ වගවෙන, සාමූහිකත්වය සහිත, එකිනෙකා පිළිබඳ සහකම්පනය සහිත සමාජයක් සඳහා නව සමාජ පරිවර්තනයක් සඳහා දැනුවත්ව පෙළගැසීමට පවතින තත්වය සියලු දෙනාට බලකරමින් සිටී.

> දැන් තවදුරටත් අපේ සමාජයට මේ ආකාරයෙන් ඉදිරියට යාමට නොව, පැවතීමටද නොහැකි ඉමකට පැමිණ තිබේ. එය විසින් ඉල්ලා සිටින්නේ කුමක්ද? ඒ, පවතින සමාජ, ආර්ථික, දේශපාලන දේහයේ ගැඹුරු වෙනසකි. සමාජ පරිවර්තනයකි. මරාදමා ඇති මනුෂ්‍යත්වයට පණ දෙන නව සමාජයක් වහාම බිහිකළ යුතුය. සමාජය පිළිබඳ වගවෙන, සාමූහිකත්වය සහිත, එකිනෙකා පිළිබඳ සහකම්පනය සහිත සමාජයක් සඳහා නව සමාජ පරිවර්තනයක් සඳහා දැනුවත්ව පෙළගැසීමට පවතින තත්වය සියලු දෙනාට බලකරමින් සිටී.



"එකිනෙකා අතර තිබූ සබඳකම් කෝපයෙන් හා කුහකමින් පිරී පැවති අතර, එයද සුව කළ නොහැකි රෝගයක් සේ නිදන් ගත විය. කෝපය හා ක්‍රෝධය නැමති රෝගයත් සමගම උපන් මිනිස්සු එය පිය පුතු පරම්පරාවෙන් ලැබූ දායාදයක් කර ගත්තෝය. කළු පැහැති සෙවනැල්ලක් මෙන්, මිනිසා මිනීවල කරා ගෙන ගිය එම කෝපාග්නිය අරමුණක් හා තේරුමක් නැති පිළිකුල් සහගත දුෂ්ටකම් කිරීමට ඔහු පොළඹවාලීය."

**මැක්සිම් ගෝර්කි**
**'අම්මා', 16-17 පිටු**

# පොලිටිකල් පංතිය

පොලිටික්කගෙ ප්‍රමාදෙ ඇතුළෙ ළමයි බර කතාවක පැටලිලා හිටියෙ. ඒ රට යන අත ගැන. එක එක්කෙනා එක එක කතා කිවුව.

“මේ කතාබහේ කිසිම තේරුමක් නෑ. රට කොහේවත් යන්නෙ නෑ...” කනිය කිවුවෙ කම්මැලිකමටද ඇත්තටමද මන්ද.

“ඇත්ත...රට යන්නෙ නෑනෙ. ඒක ඉන්දියන් සාගරේ... ඉන්දියාවට පහළින් උතුරු අක්ෂාංශ 5ත් 10ත් අතර නැගෙනහිර දේශාංශ...” අනුරුද්දියට කතාව ඉවර කරන්න හම්බ වුණේ නෑ.

“හරි හරි අපි දන්නව...” මංජුවටත් කතාව ඉවර කරන්න බැරිවුණා.

“හරි... හරි... මොකද්ද දන්නෙ... නැගෙනහිර දේශාංශ කීය කීය අතරෙද ලංකාව තියෙන්නෙ...” අනුරුද්දිය ගේම ඉල්ලුව.

“දන්නවා කිවුවෙ දේශාංශ නෙමෙයි... ඔයා ජියෝග්‍රැෆි දන්න බව...” මංජුව යන්තම් ජාම් බේර ගත්ත.

“ඔව් රට කොහෙවත් යන්නෙ නෑ...” හැමෝම සමන දිහා බැලුව. “මොකද මේ දවස්වල රනිල් රටම හානව...” ඒ කතාවට පංතියටම හිනා ගියා.

“මොකද ළමයිනේ හිනාවෙන්නෙ? මේක හිනා වෙවී පුළුවන් කාලයක්ද?” පොලිටික්ක හම් මල්ල මේසෙ උඩ තියන ගමන් ළමයි දිහා බැලුව.

“ආයුබෝවන් සර්...” අනුරුද්දියයි වසන්තියයි එකපාර කිවුවෙ ‘ගුඩ් මෝනිං’ කියන්න ගිහින් ‘මේක ගුඩ් මෝනිං කියන්න පුළුවන් කාලයක්ද’ කියල අහයි කියන බයට.

“ආයුබෝවන් ළමයිනේ... ඔයාල මොනව ගැනද කතා කරකර හිටියෙ...” පොලිටික්ක පොටක් පාද ගන්න බැලුව.

“ලොකු දෙයක් නෑ සර්... අපි කෘෂිකර්මය ගැන කතා වුණා. මේ හානව... වපුරනව වගේ දේවල්...” මංජුව ඇඟට නොදැනි කියද්දි කට්ටියට ආපහු හිනා පැන්න.

“ඇත්ත සර්... අපි හාන එක ගැන කතා වුණේ... ඒත් පොඩි අවුලකට තිබුණෙ රනිල් මේකට සම්බන්ධයි කිවුව එක...” කනියගෙ පැහැදිලි කිරීමෙන් කතාව තව අපැහැදිලි වුණා.

“පඹයො කොහෙද හාන වැඩේට සම්බන්ධ වෙන්නෙ...” පංතිය පිටිපස්සෙන් කිවුවට කවුද කියල හොයන්න බැරිවුණේ හිනා සද්දෙන් කතාව යට ගිය හින්ද.

“එහෙම කියන්න එපා ළමයිනේ... රනිල් මහත්තයා දැන් බලන්නෙ හැම කෙනාම රටේ සංවර්ධනේට දායක කරගන්න...” පොලිටික්ක රිදී රේඛා හොයනව.

“හැබැයි එයා මහ බැංකු වැඩේ සල්ලි බෙදා ගන්න කොට කාවවත් සම්බන්ධ කර ගත්තෙ නෑනෙ. එව්ව කැත වැඩ...” මංජුව ගේම ඉල්ලුව.

“පරණ දේවල් අවුස්සන්න එපා ළමයො... දැන් බලන්න අදහස් ගන්න සර්ව පාක්ෂික සමුළුවකුත් කැඳෙව්වනෙ” පොලිටික්ක සුබවාදී වෙන්න බලනව.

“සර් ඔහොම කිවුවට... අපිට ගෙවන්න වෙලා තියෙන්නෙ පරණ පවුනෙ!” චමියත් කේන්තිය වැඩිකමට ගේමට බැස්සා. “සර්ව පාක්ෂික සමුළුවත් හබක් නේද? බොරුවට 13 ඇදගෙන වීරය වෙන්න ගිහින් හොඳටම නෑව එක විතරයි”

“දැන් ක්‍රියාත්මක වෙලා තියෙන්නෙ අපේ පරණ පවු චක්‍රය ...” සමනගෙ අණ්ඩරේ හුඟ දෙනෙකුට තේරුණේ නැති බව ‘ඒ මොකද්ද ඒ චක්කරේ’ කියල අහපු වචනවලිනුයි ප්‍රශ්නාර්ථ මූණුවලිනුයි පෙනුණ.

“එයාල ණය ගන්නවා... හොරකම් කරනව... ආයි ණය ගෙවන්න ණය ගන්නවා... ආයෙ හොරකම් කරනව... වරාය වංචාව කියයි, ක්‍රිකට් පිට්ටනි වංචාව කියයි, අධිවේගී පාරවල් වංචාව කියයි, බැඳුම්කර වංචාව කියයි, සීනි වංචාව කියයි, පොල්තොල් වංචාව කියයි, සුදුළූණු වංචාව කියයි, පාන් පිටි වංචාව කියයි... අන්තිමට ණය ගොඩගැහෙනවා... රට බංකොලොත් වෙනව... ආයෙ ණය ගන්න පෙන්ෂන් ෆන්ඩ් කපනව. රාජ්‍ය ආයතන විකුණනව. සහනාධාර කපනව. ගාස්තුයි, බඩු මිලයි වැඩි කරනවා... අන්තිමට ණය බර අපේ පිටටමයි... පටි තද කරගන්න වෙන්නෙ අපිටමයි... එතකොට එයාලා... එයාලා සැපට කාලා බීලා ඉඳලා... ණය තොගයක් ගොඩගහල බැහැල යනව...” සමන සැරටම කියල දැම්ම.

“හැබැයි රනිල් මහත්තය...” පොලිටික්ක මොකද්ද කියන්න කට ඇරිය.

“රනිල් ලොක්කත් ඔය පාරෙම තමයි සර්... මොකද 2048 වෙනකොට එයා නැති බව අපිට වඩා එයා දන්නව. ඒකනෙ ඉලක්කෙ හුඟක් ඈතින් තිබ්බෙ. අපි නොදන්න රනිල්...” ඇක්ෂන් එක්ක දාපු මංජුවගෙ කතාවට පොලිටික්ක සද්දෙ වහල මල්ලට මූණ ඔබා ගත්ත.

කවුළුව හැර තබමි

# මිනිස්කම ‘Freeze’ වී ඇති සමාජය



මෙතෙක් ගරුත්වයට භාජනය වූ ගෞරව පූර්වක විශ්මයකින් යුතුව සැලකූ හැම වෘත්තියක තිබූ ප්‍රභා මණ්ඩල ධනපති පංතිය විසින් ඉවත් කෙරිණි. එය වෛද්‍යවරයා, නීතිවේදියා, පූජකයා, කවියා, විද්‍යා කටයුතුවල නිරතවන්නා ආදී සෑම කෙනෙක්ම වැටුප් ලබන ශ්‍රමිකයන් බවට පත් කළේය. ධනපති පංතිය, පවුලේ සිත් ගන්නා සුළු අනුරක්තතාවය, ආකල්ප බිඳ දමා එය හුදු මුදල් පිළිබඳ ආකල්පයක් දක්වා පහත හෙළීය.

**කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනය (1848), මාක්ස් - එංගල්ස්**

මාක්ස් මේ ප්‍රකාශය කළේ මීට අවුරුදු 175කටත් පෙරය. මුදලම පමණක් පූජනීය වූ ධනපති සමාජය තුළ සියලු මිනිස්කම් නග්න ස්වාර්ථකාමය නමැති අයිස් වතුරේ ගිල්වා දමන බව පැවසුවේත් ඔහුය. අද එය මොනතරම් පැහැදිලි සත්‍යයක් වී තිබේද! කිසිදු තෙතමනයක් සහකම්පනයක් ප්‍රාග්ධනය අශ්ලීල ලෙස නග්නවම හැසිරෙන අද සමාජය තුළ ඉතිරි වේද!

බීමත්ව ගෙදර ආ පියා තම සිඟිති දරුවාව, කේතලයේ රත්වී නටන උණුවතුර වත්කර පුළුස්සා දැමූ පුවතක් වාර්තා වූයේ මේ ඊයේ පෙරේදාය. තම ලෙයින් උපන් දරුවා උණුවතුර දමා පිළිස්සීමට තරම් නරුම පියවරුන් මේ සමාජයට දායාද කළේ කවුද? මේ සමාජය මෙතනට තල්ලු කළේ කවුද? මේ සමාජයේ අධිපතිකම් දරන්නේ කවුද? රටට මේ සා විශාල ව්‍යසනයක් වී තිබියදීත් එය ප්‍රශ්න නොකරන්නේ ඇයි? ඒ ගැන සංවේදී නොවන්නේ ඇයි? ඊට එරෙහිව නැගී නොසිටින්නේ ඇයි?

මහජනයාගේ වඩාත්ම අධ්‍යාත්මික සමාජ ආයතනය යැයි විශ්වාස කරන ‘විවාහය’ නම් සමාජ සංස්ථාව පවා නූතන ධනවාදය තුළ අශ්ලීල ගනුදෙනුවක් වී ඇත. වෙළඳපොළ “පසන් නිවසට” පස්සා දොරෙන් ඇතුළු වී ඇත. ඔබට ඔබේ දරුවන් පවා වෙළඳපොළ න්‍යායට අනුව තවකෙකුට විකිණීමට සිදුව ඇත. වෙළඳපොළ හැසිරීම ධනවාදය තුළ එතරම්ම සූක්ෂම වී ඇත. මනුෂ්‍ය සම්බන්ධතාවක් ඇතිවීමට අවශ්‍ය එකම කොන්දේසිය එම සම්බන්ධතාවයට ඇතුල් වන අය මනුෂ්‍යයන් වීම පමණක් නම් ඕනෑම අයෙකුට ඕනෑම කෙනෙකු සමග සම්බන්ධතාවක් ඇතිකර ගත හැක. එහෙත් අද අපට සැබෑ මිනිස් ආදරයේ අරුත සොයාගෙන කැලෑ පීරීමට සිදුව ඇත්තේ සහ එය හමු නොවන්නේ ඇයි?

මාක්ස් හා ඒංගල්ස් වසර 175කට පෙර ප්‍රකාශ කළේ එයය; එයින් මිදෙන මඟය.

# පිස්සු නැත්නම් ෂෝක් බබා!



මිනිසෙකුට පිස්සු හැදුණොත් වෙනත් ලෙඩක් හැදුණා වගේ නොවේය. වෙන ලෙඩක් සනීප වුණාට පසුව දැන් මිනිහට හොඳයි කියා කවුරුත් කියති. එහෙත් මිනිහෙකුට පිස්සු හැදී සනීප වුවත් සමාජය ඔහුව හඳුන්වන්නේ ‘පිස්සා’ කියාය. ඒ සමාජයේ හැටිය. ඔහු කියන දේ කවුරුත් බරපතළ ලෙස ගණන් ගන්නේද නැත. ‘ඔය යකාට පිස්සුනෙ’ කියා අවඥාවෙන් එය බැහැර කරන්නේය. එවැනි ‘පිස්සු පීකුදු හැදුණු, පිස්සු පුරෝහිතයෙකු’ රනිල්ටද දැන් සිටී. -මෙවැනි පුරෝහිතයින් සිටින විට වෙනම හතුරන් අවශ්‍ය නොවීම වෙනම කතාවකි-

ඔහු වරක් කියා තිබුණේ ‘රනිල් එක්ක ලෝක නායකයන්ට හැරෙන්න වත් බැහැ’ යැයි වැනි කතාවකි. දැන් සති දෙකකට පමණ පෙර ඔහු කියා තිබුණේ ‘ඉදිරියේදී පිටරටවල සුද්දියෝත් අපේ රටේ ගෘහ සේවිකාවන් ලෙස පැමිණෙනු ඇත’ කියාය. ඒ තරමට විශාල වැටුප් ගෙවිය හැකි සශ්‍රීක ආර්ථිකයක් රනිල් ඉදිරියේදී හදනවා කියාය.

මීට දින කිහිපයකට කලින් ඔහු කියා තිබුණේ ලෝකෙටම ණය දෙන්න පුළුවන් ශක්තිමත් රටක් බවට ළඟදීම අපේ රට පත්වෙන බවය. ඒ රනිල්ගේ විශ්වකර්ම ආර්ථික සංවර්ධන වැඩසටහන නිසා බවයි.

මෙහෙම කියන්නෙ ලෙඩෙකුට බෙහෙත් පෙත්තක්, ළමයෙකුට කිරි ටිකක් වත් දී ගන්න බැරි පාලනයක් පවත්වාගෙන යන ගමන්ය. ආසියාවේ දුර්වලම මුදල් ඒකකය රුපියල බවට පත්ව ඇති පසුබිමක සිටය.

මේවා අසන ලක්වැසි සියලු දනන් හටද පිස්සු නම් අර පිස්සා කියන එක හරියටම හරිය.

# එසේ වී නම් මෙසේ වන්නේ නැත...

1953 අගෝස්තු මාසය යළි මඳකට සිහියට නඟා ගන්න. ඒ රටේ වැඩකරන ජනයා ප්‍රමුඛ බහුජනතාව විසින් මේ රටේ නරුම පාලක කල්ලිය පළමු වරට ඔසවා මුහුදට විසිකළ මාසයයි. සියලු බලය සහ බලවතුන් ජනතා බලය ඉදිරියේ පරඬැල් බව ලාංකේය සලකුණ ඇතිව ඔප්පු කළ මාසයයි. ඉන් හරියටම වසර 69කට පසු මහජනතාව රවටා 69 ලක්ෂයක ඡන්දයකින් බලයට ආ නරුම පාලකයාවද ඔහුගේ පාලක ඥාති සංග්‍රහය හා පරිවාර ගැත්තන්ද උන්හිටි තැන් සොයා ගැනීමටවත් නොහැකි වන පරිදි රටේ ජනතාව විසින් එලෙසම පළවා හරින ලදී. ඉතිහාසයේ සරදමක් ලෙස ඒ පාලකයාද අවසන් මොහොතේ මන්දිරයෙන් පලා ගියේ මුහුදිනි.



තත්වය එසේ වුවද ජනතා අරගලය ජනතා ජයග්‍රහණයකින් කෙළවර කර ගැනීමට අවශ්‍යම ප්‍රධාන දේශපාලන මූල ද්‍රව්‍ය, එසේ නොමැතිනම් අවශ්‍යම දේශපාලන සංඝටක මේ අරගල ද්විත්වයේම නොතිබූ බව කණගාටුවෙන් වුවද කිව යුතුව ඇත. එනම් පංතිය, පක්ෂය, නායකත්වය සහ වැඩපිළිවෙළ නිසි මාත්‍රානුකූලව සංයෝග නොවීමයි. මේ සාධක හතර අතහැර හෝ නොසලකා කළ අරගල අවසානයේ ප්‍රතිගාමිත්වයටම දොරටු විවර කිරීමට ඉරණම් වී ඇති බව ඉතිහාසය වුවමනාවටත් වඩා සාක්ෂි දරයි.

2023 ජුලි 19

# පිටි මිල අඩුවීමේ වාසිය ජනතාවට නොදෙන්නේ මැතිවරණවලට අරමුදල් හොයන්නද?

*(ස්ථාවර නියෝග 27/2 යටතේ ප්‍රශ්නයක් ඉදිරිපත් කරමින්)*

සමාගම් දෙකකට වෙළඳපොලේ තිරිඟු පිටි ඒකාධිකාරයක් හිමිකර දීමට පියවර ගැනීම හේතුවෙන් බේකරි කර්මාන්තයට හා පොදුවේ පාරිභෝගික ජනතාවට මුහුණ පෑමට සිදුවී ඇති ගැටලුකාරී තත්වය පිළිබඳව මෙම ගරු සභාවේ අවධානය යොමු කරනු කැමැත්තෙමි. අද වනවිට දිවයින පුරා බේකරි 6,000ක් පමණ ක්‍රියාත්මක වන අතර, බේකරි කර්මාන්තය මගින් ලක්ෂ පහක පමණ පිරිසක් තමන්ගේ ජීවනෝපාය සලසා ගන්නවා.

එසේම ප්‍රධාන ආහාරය වන බත් හැරෙන්නට වතුකරයේ ජනතාව ඇතුළු වැඩිම පිරිසක් පරිභෝජනය කරනු ලබන ආහාර වර්ග ගණනාවක ප්‍රධාන අමුද්‍රව්‍ය වනුයේ තිරිඟු පිටියි. මේ අනුව තිරිඟු පිටි මිල පාරිභෝගිකයන් විශාල පිරිසකගේ ජීවන වියදමේ විශාලතම පංගුව වන ආහාර වියදම්වලට සෘජුව බලපෑමක් ඇති කරනවා. ඒක ඔබතුමාත් දන්නවා. තිරිඟු පිටි කියන්නේ අපට වැදගත් පාරිභෝගික භාණ්ඩයක්.

මෙවැනි තත්වයක් තිබියදී ආණ්ඩුව 2023.06.14 දාතමින් නිකුත් කළ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් සහ ආනයන පාලකවරයාගේ 2023.06.16 දිනැති ලිපිය මගින් සහ ආනයන බලපත්‍ර නොමැතිව තිරිඟු පිටි ආනයනය කිරීම තහනම් කර තිබෙනවා. මා ළඟ තිබෙනවා, මුදල් අමාත්‍යවරයා ලෙස ගරු රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා විසින් නිකුත් කරන ලද ගැසට් නිවේදනය. මේ ගැසට් නිවේදනයෙන් තිරිඟු පිටි ආනයනය මුළුමනින්ම තහනම් කර තිබෙනවා. ඒ වාගේම ආනයන පාලකවරයා විසින් නිකුත් කරන ලද ලිපිය මා ළඟ තිබෙනවා. ඒ අනුව, තිරිඟු පිටි ආනයනය තහනම් කර තිබෙනවා.

එසේම ආනයන බලපත්‍ර නිකුත් කිරීමක් ද සිදුකර නැහැ. ඒ වේලාවේදී කිව්වා, තිරිඟු පිටි ආනයනය තහනම් කළාට ආනයන බලපත්‍රයක් නිකුත් කරනවා කියලා. නමුත්, මේ වනතෙක් එවැනි බලපත්‍රයක් නිකුත් කරලා නැහැ. ඒ අනුව, දේශීය තිරිඟු පිටි අවශ්‍යතාව සපුරාලීමේ කටයුත්ත තිරිඟු ඇට ආනයනය කර මෙරටදී පිටි නිෂ්පාදනය කරනු ලබන බහුජාතික සමාගම් දෙකක ඒකාධිකාරයට පත්කර තිබෙනවා. ඒ කියන්නේ, තිරිඟු පිටි ආනයනයට ඉඩ දෙන්නේ නැත්නම් මුළුමනින්ම ප්‍රීමා ආයතනයත්, සෙරන්ඩිබ් ආයතනයත් තමයි අපේ රටට අවශ්‍ය තිරිඟු පිටි නිෂ්පාදනය කරනු ලබන්නේ. එතකොට මේ මුළු තිරිඟු පිටි වෙළඳපොළම ප්‍රීමා ආයතනයේත්, සෙරන්ඩිබ් ආයතනයේත් ඒකාධිකාරයක්.

ගැටලුව වන්නේ ආනයනය කරනු ලබන තිරිඟු ඇටවලින් දේශීයව නිෂ්පාදනය කරනු ලබන තිරිඟු පිටි අයුතු ලාභයක් ලබමින් වැඩි මිලකට අලෙවි කිරීමට මෙම සමාගම් විසින් පියවර ගෙන තිබීමයි. ඔවුන් වෙළඳපොලේ තිරිඟු පිටි කිලෝග්‍රෑම් 1ක් අලෙවි කරන්නේ රුපියල් 210ක් තරම් ඉහළ මිලකටයි. එසේම ඔවුන් ආනයනය කරනු ලබන තිරිඟු ඇට කිලෝ ග්‍රෑම් 1ක් වෙනුවෙන් රජයට ගෙවනු ලබන්නේ රුපියල් 3ක බදු මුදලක් පමණයි.

කෙසේ වුවද, රජයේ තිරිඟු පිටි ආනයන තහනම තුළ දේශීය පිටි අළෙවියේදී මෙම සමාගම් අධික ලාභ ලබන බව හෙළි වන්නේ ලෝක වෙළඳපොලේ තිරිඟු පිටි මිල සංසන්දනය කර බැලීමේදීයි. නිදසුනක් ලෙස තුර්කියෙන් ශ්‍රී ලංකාවට තිරිඟු පිටි ආනයනය කිරීමේදී පිටි කිලෝග්‍රෑම් 01ක වරායට ගොඩ බෑ හැකි මිල රුපියල් 110ක් පමණයි. ඒ කියන්නේ රුපියල් 110ට පිටි කිලෝග්‍රෑම් එකක් වරායට ගෙනෙන්න පුළුවන් වුණත්, මෙ සමාගම් පිටි කිලෝග්‍රෑම් එකක මිල තීරණය කරලා තිබෙන්නේ රුපියල් 210ට. නමුත්, ඊට කලින් පනවා තිබූ බදු මුදල වන රුපියල් 35ක මුදලද එකතු කර, ලාභයක් ද සහිතව වෙළෙඳපොලේ රුපියල් 160ක පමණ මුදලකට පිටි කිලෝග්‍රෑම් එකක් අලෙවි කළ හැකි බව බේකරි කර්මාන්තකරුවන් විසින් පෙන්වා දී තිබෙනවා.

2023 ජනවාරි මාසෙය් තුර්කි තිරිඟු පිටි මෙට්‍රික් ටොන් එකක මිල ඩොලර් 535ක් වූ නමුත්, පෙබරවාරි මාසයේ 510ක්ද, මාර්තු මාසයේ 490ක්ද, අප්‍රේල් මාසයේ ඩොලර් 440ක්ද, මැයි මාසයේ 377ක්ද, ජූනි මාසයේ හා ජූලි මාසයේ ඩොලර් 355ක්ද වශයෙන් ක්‍රමිකව මිල පහත වැටී තිබෙනවා. ඒ කියන්නේ තිරිඟු පිරි මෙට්‍රික් ටොන් එකක මිල ජනවාරි මාසයේදී ඩොලර් 535ක වුණත්, වර්තමානයේ ලෝක වෙළෙඳපොලේ තිරිඟු පිටි මෙට්‍රික් ටොන් එකක මිල ඩොලර් 355යි. ඒ කියන්නේ, තුනෙන් එකකට වැඩි ප්‍රමාණයකින් ලෝක වෙළෙඳපොලේ තිරිඟු පිටි මිල අඩු වී තිබෙනවා.

ලෝක වෙළෙඳපොලේ පවතින තිරිඟු පිටි මිල සම්බන්ධයෙන් වන වාර්තාවක් මා ළඟ තිබෙනවා. මෙම වාර්තාව දෙස බැලුවාම ඉතා හොඳින් පෙනෙනවා. ලෝක වෙළෙඳපොලේ පිටි මිල ශීඝ්‍රයෙන් පහළ යමින් තිබෙන බව. මේ වාර්තාව අනුව පෙනී යනවා. ඩොලර් 510ක් වැනි අධික මිලකට තිබුණු තිරිඟු පිටි මෙට්‍රික් ටොන් එකක මිල ඩොලර් 377ක් දක්වා අඩුවී තිබෙන බව. ඒ අනුව, මේ වෙනකොට ලෝක වෙළෙඳපොලේ තිරිඟු පිටි මිල අඩුවෙලා තිබෙනවා. එසේම ජනවාරි මාසයේ ලෝක වෙළෙඳපොලේ ඩොලර් 310ක වුණු තිරිඟු ඇට මෙට්‍රික් ටොන් එකක මිල පෙබරමාරි මාසයේ ඩොලර් 307ක් ද, මාර්තු මාසයේ ඩොලර් 302ක් ද, අප්‍රේල් මාසයේ ඩොලර් 292ක් ද, මැයි මාසයේ ඩොලර් 279ක් ද, ජූනි මාසයේ ඩොලර් 245ක් ද, ජූලි ඩොලර් 238ක් ද වශයෙන් අඩු වෙලා තිබෙනවා. තිරිඟු ඇටවල මිලත් අඩුවෙලා තිබෙනවා. ජනවාරි මාසයේ ඩොලර් 310ක් වුණු තිරිඟු ඇට මෙට්‍රික් ටොන් එකක මිල ජූලි මාසය වෙනකොට ඩොලර් 238ක් දක්වා විශාල ලෙස අඩුවී තිබෙනවා.

අනෙක් අතට, ජනවාරි මාසයේ රුපියල් 362.42ක් වුණු ඩොලරයේ අගය ජූනි මාසය වන විට සටහන් වූයේ රුපියල් 301.26ක් ලෙසයි. ඒ අනුව මෙම පිටි නිෂ්පාදන සමාගම් අතිශය අසාධාරණ ලාභයක් ලබන බව ඉතා පැහැදිලියි. ලෝක වෙළෙඳපොලේ ඉතා වේගයෙන් පිටි මිල අඩු වෙනවා. තිරිඟු ඇටවල මිලත් ලෝක වෙළෙඳපොලේ ඉතා වේගයෙන් අඩු වෙනවා. ඒ වාගේම පසුගිය ජනවාරි මාසයේ රුපියල් 362ක් ලෙස පැවැති ඩොලරයේ අගයත් රුපියල් 301ක් දක්වා අඩු වෙලා තිබෙනවා. දැන් මොකක්ද වෙන්න ඕනෑ? මේ වාසිය පාරිභෝගික ජනතාවට දෙන්න ඕනෑ. හැබැයි, ආණ්ඩුව මොකක්ද කළේ? ආණ්ඩුව කළේ ජූනි මාසයේ 14 වැනිදා ගැසට් නිවේදනයක් නිකුත් කරලා තිරිඟු පිටි ආනයනය නතර කිරීමයි. ඒ වාගේම අනෙක් බලපත්‍ර ලබා දීමත් නතර කළා.

එතකොට මොකක්ද වුණේ? සෙරන්ඩිබ් ආයතනයේ සහ ප්‍රීමා ආයතනයේ ඒකාධිකාරිත්වයක් හැදුණා. මේ ප්‍රීමා ආයතනය මැතිවරණ කටයුතු සඳහා දේශපාලන ව්‍යාපාරවලට සල්ලි දෙන බව ඉතා ජනප්‍රිය, ප්‍රසිද්ධ කතාවක්. ජනතාව මේවා දන්නවා. දැන් මොකක්ද කළේ? ලෝක වෙළෙඳපොලේ තිරිඟු පිටි මිල අඩු වෙමින් තිබියදී, ඩොලරයේ අගයත් පහළ යමින් තිබියදී තිරිඟු පිටි කිලෝග්‍රෑම් එකකට රුපියල් 35ක බද්දක් ගහලාත් පාරිභෝගික ජනතාවට රුපියල් 160ක් වැනි මිලකට තිරිඟු පිටි කිලෝග්‍රෑම් එකක් ලබා දෙන්න පුළුවන්කම තිබියදී ප්‍රීමා ආයතනයට සහ සෙරන්ඩිබ් ආයතනයට මේ පගාව දුන්නේ කවුද? සාගල රත්නායකව ප්‍රශ්න කරන්න ඕනෑ කියලයි මම කියන්නේ. ඒක මතක තබා ගන්න. මේකයි මේ අය කළේ. ජනාධිපති උපදේශක වැඩේ විතරක් ඔහු කරන්න ඕනෑ. මුදල් අමාත්‍යාංශයට තිබෙන බදු තීරණය කිරීමේ බලය කොහොමද ඔහුට ලැබිලා තිබෙන්නෙ? ඔහු කොහොමද ඒ පිළිබඳ තීන්දු තීරණ ගන්නේ? ඔහු කොහොමද බලපෑම් කරන්නේ?

අද ලෝක වෙළඳපොලේ පිටි මිල අඩු වෙමින් තිබියදී, ඩොලරයේ අගය අඩු වෙමින් තිබියදී, තිරිඟු පිටි ආනයනය මුළුමනින්ම නතර කරලා සමාගම් දෙකක අතර ඒකාධිකාරිත්වයක් හදලා තිබියදීත් තිරිඟු පිටි කිලෝග්‍රෑම් එකක් රුපියල් 210යි. ඊයෙ රෑ තිරිඟු පිටි කිලෝග්‍රෑම් එකක මිල රුපියල් 10කින් අඩු කරලා තිබෙනවා. බේකරි හිමියන්ට විතරක්. ඒ, මේ ගැන දැනගෙන වෙන්න ඇති.

මෙවැනි තත්වයක් තුළ දේශීය වශයෙන් සාපේක්ෂ මිල අඩු කිරීමකට බල නොකර සහ ආනයනික තිරිඟු පිටි කිලෝග්‍රෑම් එකකින් රජයට හිමි විය යුතු රුපියල් 35ක බදු මුදලද අහිමි කර ගනිමින් ආණ්ඩුව තිරිඟු පිටි ආනයනයට තහනමක් පනවා පාරිභෝගිකයන් සූරාකෑමට පිටි නිෂ්පාදන සමාගම් දෙකකට ඉඩ දී තිබෙන්නේ කුමන හේතුවක් නිසාද යන්න ගැටලුවක්. මොකද, තිරිඟු පිටි ආනයනයට රුපියල් 35ක බද්දකුත් ගැහුවා. නමුත් දැන් ඒ බද්දත් නැහැ. පාරිභෝගික ජනතාවට සාධාරණ මිලකට තිරිඟු පිටි ලැබෙන්නෙත් නැහැ. ඒ නිසා මම දැනගන්න කැමතියි. මේ තීන්දු තීරණ ගැනෙන්නේ කොහොමද කියලා. ඒ විතරක් තිරිඟු පිටි ආනයන තහනම පැනවීමේදී ආනයනය සඳහා බලපත්‍ර ක්‍රමයක් හඳුන්වා දෙන බව ප්‍රකාශ වුවද, මේ වනතෙක් ඒ පිළිබඳ තීරණයක් ප්‍රකාශයට පත්වී නැහැ. අවම වශයෙන් ලෝක වෙළෙඳපොලේ තිරිඟු පිටි මිල අඩුවීමේ වාසිය පාරිභෝගිකයන්ට ලබාදෙන ලෙස මෙම සමාගමවලින් ඉල්ලීමට පවා ආණ්ඩුව බිය වී සිටිනවාදැයි දැන් අපට සැකයක් මතුව තිබෙනවා.

අනෙක් හැම එකකටම වාගේ රජයෙන් පාලන මිලක් දමනවා. හැබැයි, මේකට කළේ මොකක්ද? තිරිඟු පිටි කිලෝග්‍රෑම් එකක් රුපියල් 210ට වැඩියෙන් විකුණන්න බැහැ කිව්වා. එහෙම නම් මොකක්ද සිදුවී තිබෙන්නේ?

මෙම තත්වය තුළ මතුවන පහත ගැටලුවලට අදාළ අමාත්‍යවරයා පිළිතුරු ලබාදෙනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

01. ලෝක වෙළෙඳපොලේ තිරිඟු පිටි මිල අඩු වෙමින් තිබියදී තිරිඟු පිටි ආනයනය නතර කිරීමට පියවර ගනු ලැබුවේ කවර හේතු නිසාද?

02. ප්‍රකාශ කර ඇති පරිදි, තිරිඟු පිටි ආනයනය කිරීම සඳහා ආනයන බලපත්‍ර නිකුත් කිරීමක් සිදු කරන්නේද? එම බලපත්‍ර ලබාදීම සඳහා වන ක්‍රමවේදය කුමක්ද?

03. ලෝක වෙළෙඳපොලේ තිරිඟු පිටි මිල සහ තිරිඟු ඇට මිල ක්‍රමිකව වේගයෙන් අඩු වෙමින් තිබියදී ආනයන නතර කිරීමෙන් වෙළෙඳපොළ තුළ තිරිඟු පිටි ඒකාධිකාරයක් ගොඩනැගුණු බවත්, පාරිභෝගිකයාට අසාධාරණයක් වූ බවත් පිළිගන්නේද?

04. ජනතාවගේ අත්‍යවශ්‍ය ආහාර පරිභෝජනය හා බැඳුණු මෙම කරුණු සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය මැදිහත්වීම් කිරීමට කටයුතු කරන්නේද? ඒකාධිකාරයෙන් පාරිභෝගිකයා බේරා ගැනීමට ආණ්ඩුව කටයුතු කරන්නේද, ඒ වෙනුවෙන් ආණ්ඩුව ගන්නා පියවර කවරේද? කියාත් මම දැනගන්න කැමතියි.



ජාතික ජන බලවේගයේ නායක,
පාර්ලිමේන්තු මන්ත්‍රී
**අනුර කුමාර දිසානායක සහෝදරයා**

## ජනතාවගේ අරමුදල්...

01 වැනි පිටුවෙන්

කුසගින්නේ වේදනාව වාරණයෙන් නතර කරන්න බැහැ. ගොවි ජනතාවට නෙළාගන්න අස්වැන්නට සාධාරණ මිලක් නැහැ. ගොවි ජනතාවගේ වේදනාව, විරෝධය වාරණවලින් නවතන්න බැහැ. දීර්ඝ කාලයක් තිස්සේ රට දුකෙන් දුකට පත් කළා. ජනතාව දුකෙන් දුකට පත් කළා. බුර බුරා නැගෙන ජනතාවගේ වේදනාව, ඒ නිසා නැගෙන සාධාරණ විරෝධය, වාරණවලින්, කඩදාසිවලින් නතර කරන්න බැහැ. මේ පාලකයන් පළවා හැරීම සඳහා ජාතික ජන බලවේගය සමග ඒකාබද්ධව පෙරට එන බව අපට විශ්වාසයි.

රනිල් වික්‍රමසිංහලා, මහින්ද රාජපක්ෂලා අපේ ආර්ථිකයට කරපු අපරාධයට වන්දි ගෙවන්න සිදුවෙලා තිබෙන්නේ පොදු ජනතාවටයි. විදුලි බිල ගෙවා ගන්න නොහැකි වෙලා, අගෝස්තු මාසෙ සිට වතුර බිල වැඩි කරනවා. අත්‍යවශ්‍ය සියලුම භාණ්ඩවල මිල වැඩිකරලා, පඩිපත කපනවා. රැකියා නැතිවෙලා. කර්මාන්ත ශාලා වැහිලා. මුළු රටම විනාශ වෙලා. අපි රනිල් වික්‍රමසිංහට කියනවා, තවදුරටත් විනාශයේ පතුළට ඇදගෙන යන්නේ නැතිව කරුණාකරලා බැහැලා යන්න. මේ රටේ ජනතාවත් සමග මේ රට බාර ගන්න, මේ රට ගොඩනගන්න ජාතික ජන බලවේගය සූදානම්."

## ජනතාව වහලුන් කරන IMF...

01 වැනි පිටුවෙන්

දීර්ඝ කර, දවසකට පැය 12ක් වැඩ කළ යුතු තත්වයක් නීතිගත කරන්න යනවා. සේවකයාගේ කැමැත්ත අනුව බව කියමින් දවසකට පැය 16 දක්වා වැඩ ගන්න උත්සාහයක් තිබෙනවා. වෘත්තිය සමිතියක් පිහිටුවීමේ අයිතිය සම්බන්ධ නීතිය වෙනස් කරන්න යනවා. හාම්පුතාට වෘත්තිය සමිති පිහිටුවීම සම්බන්ධයෙන් බාධා කරන්න බැහැ. එවැනි අවස්ථාවක කම්කරු කොමසාරිස්ට දැනුම් දී නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාව ඒ ආයතනයේ වැඩකරන ජනතාවට තිබුණා. වෘත්තිය අයිතිවාසිකම් වෙනුවෙන් සංවිධානය වෙන්න තිබූ මේ අයිතියත් අලුත් පනතින් අහෝසි කරන්න යනවා. ඒ වගේම හාම්පුතාට දැනුම් නොදී හදිසි වෘත්තිය අයිතිවාසිකමක් වෙනුවෙන් ක්‍රියාකිරීම අධිකරණයෙන් දඬුවම් ලැබිය හැකි වරදක් බවට පත්කරන්න සූදානම් වෙනවා.

වෘත්තිය සමිති පිහිටුවීමේ යාන්ත්‍රණයත් දුබල කරන යෝජනා මේ තුළ තිබෙනවා. යම් උද්ඝෝෂණ ක්‍රියාමාර්ගයකට වෘත්තිය සමිතියේ බහුතර සාමාජිකයන්ගේ අනුමැතිය ලබාගත යුතු බවට සංශෝධන නීති ගේන්න යනවා. පාලකයන්ගේ හදිසි අත්තනෝමතික ක්‍රියාමාර්ගවලට එරෙහිව ක්‍රියාකරන්න සාමාජිකයන්ගේ ඡන්ද පවත්වලා කල්මරන්න බැහැ. ඒ වගේම කාන්තාවන්ගෙන් වැඩගැනීමේදී පනවා තිබූ සීමාවන් ඉවත් කර, මේ දක්වා ලබාදී තිබූ සියලු සහන අහෝසි කරන්න උත්සාහ කරනවා."

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com




ගීතය හා ජීවිතය ගැන වැඩසටහනකට එක්වී...



ජාතික සමගිය වෙනුවෙන් එක්වන්නට




ගොවි ජන සටනට පණපොවා



මැතිවරණය වෙනුවෙන් සටන නීතිය හමුවට



පරිසරය රැකීමට හඬ අවදි කර



ජන අයිතිය වෙනුවෙන් මහජන වේදිකාවල

# ජනතාව සමග එක්වී ආණ්ඩුවේ මර්දනය පරාජයට පත් කරනවා

## ජාතික ජන බලවේගයේ නායක අනුර දිසානායක සහෝදරයා



වත්මන් ආර්ථික අර්බුදය පාලකයන් විසින් නිර්මාණය කරන ලද අර්බුදයක් බවත් ජනතාවගෙන් කිසිවෙක් මේ අර්බුදයට වගකීමට අවශ්‍ය නොවන බවත් පාලකයන්ට එරෙහිව ජනතාව පාරට බැසීම සාධාරණ බවත් පෙන්වා දුන් ජාතික ජන බලවේගයේ නායක අනුර දිසානායක සහෝදරයා, පාලකයන් පළවා හැරීමට ජනතාව සංවිධානය වීම අතිශය සාධාරණ බවත් ජනතාව සමග ඒකාබද්ධව ජනාධිපතිවරයාගේ හා ආණ්ඩුවේ වියරු, ප්‍රජාතන්ත්‍ර විරෝධී, මර්දනකාරී වැඩපිළිවෙළ පරාජයට පත්කරන බවත් අවධාරණය කළේය.

අනුර දිසානායක සහෝදරයා මෙම අදහස් පළ කළේ උද්ඝෝෂණයක් අතරතුර මාධ්‍යවේදී තරිඳු උඩුවරගෙදර පොලීසිය විසින් අත්අඩංගුවට ගැනීමට එරෙහිව පසුගිය 29වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය හමුවකදීය.

මෙහිදී වැඩිදුරටත් කරුණු දැක්වූ අනුර දිසානායක සහෝදරයා මෙසේද පැවසීය.

"ජාතික ජන බලවේගයේ අපි මේ රටේ ජනතාවගේ අයිතීන් දිනාගැනීම වෙනුවෙන් ජනතාව සමග එක්ව පාරට බහින්න, සටන් කරන්න සූදානම්. එය මේ ආණ්ඩුවෙන් ඉල්ලීම් දිනාගැනීම සඳහා පමණක් නොවෙයි, ආණ්ඩුව කරන විනාශකාරී ක්‍රියාදාමයන් නතර කිරීම සඳහාත්, මේ ආණ්ඩුව පළවා හැර ජනතාවාදී පාලනයක් ගොඩනැගීම අරමුණු කරගෙන මේ බලවේගය අපි සූදානම් කරනවා. ජනතාවගේ බුර බුරා නැගෙමින් තිබෙන වේදනාව, කුඩා කෙනෙත්තිලිවලින්, පීඩාවන්ගෙන් වළක්වන්න නොහැකි බව රනිල් වික්‍රමසිංහ තේරුම් ගත යුතුයි.

මේ ආකාරයට ජනතාව මර්දනය කිරීමට දරන මේ ප්‍රයත්නය, ජනතා බලය හමුවේ සහතික වශයෙන්ම පරාජයට පත් කරනවා. ඒ වෙනුවෙන් සියලුම ක්ෂේත්‍රවල පුරවැසියන් ඒකාබද්ධව මේ මර්දනය පරාජයට පත්කරන්නත්, ජනතාවගේ අයිතීන් දිනාගැනීමටත්, මේ පාලනය පළවා හැර ජනතාවාදී පාලනයක් ගොඩනැගීමටත් අපි කටයුතු කරනවා."

# ජනතාවාදී පාලනයක් වෙනුවෙන් පොදු ජනතාව ලෙස අපිත් එකතු වෙමු

## ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා



මහින්ද රාජපක්ෂටත් රනිල් වික්‍රමසිංහටත් එකට සිට රට පාලනය කළ හැකිනම් ජනතාවාදී පාලනයක් වෙනුවෙන් ජනතාව ලෙස අප සැමට එකතු වීමට නොහැකි මන්දැයි විමසා සිටි ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා, ලැබෙන පළමු පැයේදීම දුෂ්ට පාලක නඩය පළවා හැර ජනතාවට සතුටින්, ජීවත් විය හැකි පාලනයක් නිර්මාණය කිරීමට සියලු දෙනාම එකතු වෙමු යැයි ආරාධනා කර සිටියේය.

ටිල්වින් සිල්වා සහෝදරයා මෙසේ ප්‍රකාශ කළේ පසුගිය 16වැනි දින පැවති ජාතික ජන බලවේගයේ මීගමුව ආසන සමුළුව අමතමිනි. මෙහිදී තවදුරටත් අදහස් පළ කළ ටිල්වින් සිල්වා සහෝදරයා මෙසේද පැවසීය.

"රනිල්ලගේ මර්දනයට බය නැති, යුක්තිය වෙනුවෙන් සටන් කරන්න ඉදිරිපත් වෙන, හයිය තිබෙන ජනතාවක් නිර්මාණය වී ඉන්නවා. ජාතික ජන බලවේගය ගැන ප්‍රතිපත්තිමය විවේචනයක් කරන්න බැරි නිසා, ක්‍රියාමාර්ග ගැන විවේචනය කරන්න බැරි නිසා, මඩ-අවලාදවලින් නතර නොවී සමාජය තුළ ජාතිවාදය අවුස්සන්නත් ක්‍රියාකරනවා.

ජාතිවාදයෙන් තොර, මනුෂ්‍යත්වයෙන් සලකන එක කඳවුරකට අපි හැමෝම එකතු වෙන්න ඕනෑ. ඉදිරියේදී ඉර දෙපැත්තට බෙදෙන්නේ පොහොට්ටුද, අලිද කියලා නොවෙයි; රට බංකොලොත් කළ කණ්ඩායම සහ රට ගොඩනඟන මාලිමාව කියලයි. සතුරන් සියලු දෙනා එකට තියලා හොර නඩය පරාජයට පත් කර, යුක්තියෙන් ජීවත් විය හැකි, සාධාරණයෙන් ජීවත් විය හැකි සමාජයක් ගොඩනඟන්න ඕනෑ. ආර්ථික සාධාරණත්වය තිබෙන, දේශපාලන සාධාරණත්වය තිබෙන, ප්‍රජාතන්ත්‍රවාදය තිබෙන, ජාතික සමගිය තිබෙන, මනුෂ්‍යත්වය තිබෙන සමාජයක් අපි මේ දෑතවලින් ගොඩනඟමු. ඒ ඉතිහාසය අලුතින් ලියන පරම්පරාව අපි වෙමු. රටේම මහජනතාවගේ ජයග්‍රහණය වෙනුවෙන් ජාතික ජන බලවේගය දිනවමු."

# තමන්ගේ ජීවිත සමඟ සෙල්ලම් කරන ආණ්ඩු ගැන ජනතාව තීන්දුවක් ගත යුතුයි

## ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභික වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා



සෞඛ්‍ය ඇමතිවරයා සහ ඔහුගේ ගජමිතුරන් කිසිදු වගකීමකින් තොරව ජනතාවගේ ජීවිත මරණය කරා ගෙනයමින් ඇති තත්වය තුළ ඇතැමුන් ප්‍රතිකාර ගැනීම සහ ශල්‍යකර්ම සිදුකර ගැනීම සම්බන්ධයෙන් දෙගිඩියාවකට පත්වී රජයේ රෝහල් පිළිබඳ විශ්වාසයක් බිඳ ගනිමින් සිටින බවට චෝදනා කළ ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභික වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා, ජනාධිපතිවරයාගේ සිට කැබිනට් මණ්ඩලයත්, මුළු ආණ්ඩුවමත් රෝගීන්ගේ ජීවිත නැතිවීම සම්බන්ධයෙන් වගකීම බාරගත යුතුව ඇති බවත් තමන්ගේ ජීවිත සමග සෙල්ලම් කරන ආණ්ඩු පිළිබඳව දේශපාලන තීන්දුවක් ගැනීමට ජනතාව ක්‍රියා කළ යුතුව ඇති බවත් අවධාරණය කළේය.

වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා මෙසේ පැවසුවේ පසුගිය 14වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද ජාතික ජන බලවේගයේ මාධ්‍ය හමුවකදීය. මෙහිදී තවදුරටත් කරුණු දැක්වූ ඔහු මෙසේද පැවසීය.

"ඇමතිවරයාට ළඟ නිලධාරීන්ගේ අත්සන සහිතව ඖෂධ ගෙන ඒමේ ක්‍රියාවලියක් සිදුකරනවා. අපේ රටේ රෝගීන් කිහිපදෙනෙකුගේ ජීවිත අහිමි වී තිබෙන්නේ මේ දූෂිත ක්‍රියාවලිය නිසයි. පෝලිමෙන් පිට ටෙලි නාට්‍ය පන්නලා රාජ්‍ය මාධ්‍යවල විකාශනය කරන්න ටෙලි නාට්‍ය ලබාගත් ක්‍රියාවලිය ඖෂධ ගෙන්වීමේදී අනුගමනය නොකරන ලෙස අපි අනතුරු හඟවනවා. "

# ජීවිත වටිනාකම බාල්දු කළ ආණ්ඩුව එළවන්න සියලු කාන්තාවන් පෙරමුණ ගත යුතුයි

## අයිතීන් උදෙසා කාන්තාවෝ සංවිධානයේ ලේකම් සමන්මලී ගුණසිංහ සහෝදරිය



ජනතාවගේ මනස හඳුනාගත්, ජනතා අවශ්‍යතා තේරුම් ගත හැකි ආණ්ඩුවක් රටට අවශ්‍ය බව අවධාරණය කළ අයිතීන් උදෙසා කාන්තාවෝ සංවිධානයේ ලේකම් සමන්මලී ගුණසිංහ සහෝදරිය, ජන ජීවිතවල වටිනාකම බාල්දු කළ, ජනතාව කෙරෙහි කිසිදු සංවේදීකමක් නොමැති ආණ්ඩුව පළවා හරින්නට රටේ සියලුම කාන්තාවන් පෙරමුණ ගත යුතු යැයි ඉල්ලා සිටියාය.

සමන්මලී ගුණසිංහ සහෝදරිය මේ බව ප්‍රකාශ කළේ පසුගිය 22වැනි දින අයිතීන් උදෙසා කාන්තාවෝ සංවිධානය විසින් ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය හමුවකදීය. එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ සමන්මලී සහෝදරිය මෙසේද පැවසුවාය.

"බෙහෙත් ගෙන්වා ගැනීමට නොහැකි තත්වයට වඩා ඔබ්බට ගිය විශාල අර්බුදයක් දක්වා සෞඛ්‍ය පද්ධතියම කඩා වට්ටා තිබෙනවා. ගැබිණි මවවරුන්ට අත්‍යවශ්‍ය ඖෂධ නොමැතිවීම, දරුවන් සඳහා අවශ්‍ය ඖෂධ නොමැති වීම තුළ මේ ආණ්ඩුව අපේ දරුවන්ගේ ජීවිතවලට, අම්මාවරුන්ගේ ජීවිතවලට වගකියන්නේ නැති බව පැහැදිලියි.

අද බෙහෙත් ගෙන්වීම සිදුවෙන්නේ ඇමතිවරයාට, ඇමතිවරයාගේ කොමිස්කාරයන්ට වුවමනා විදිහටයි. කොමිස් බලාපොරොත්තුවෙන් ගෙන්වන බාල බෙහෙත් නිසා තමයි රෝහලට ඇතුළත් වෙන අයට පෙට්ටියෙන් එන්න වෙලා තිබෙන්නේ. "


බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.